

MINISTRY OF PARLIAMENT REFORMS &
MASS MEDIA

SELACINE
TELEVISION INSTITUTE

# 2013

වාර්ෂික වාර්තාව

ஆண்டறிக்கை

ANNUAL REPORT

ගරු පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා
පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
කොළඹ 5.

ගරු අමාත්‍යතුමනි,

**වාර්ෂික වාර්තාව - 2013**
1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තිය ප්‍රකාරව 2013 වසර සඳහා වාර්ෂික වාර්තාව සැලසිනෙ රූපවාහිනී ආයතනය වෙනුවෙන් ගෞරවයෙන් ඉදිරිපත් කරමි.



තුසිත ජයවර්ධන
සභාපති
සැලසිනෙ රූපවාහිනී ආයතනය
කොළඹ 7.

# පෙළ ගැස්ම

| | |
|---|---|
| දැක්ම මෙහෙවර අරමුණු | 03 |
| සභාපතිතුමාගේ සමාලෝචනය | 05 |
| පරිපාලන ව්‍යුහය 2013 හා සම්බන්ධීකරණ තොරතුරු | 06 |
| ආයතනික තොරතුරු | 07 - 13 |
| මූල්‍ය වාර්තා සඳහා සටහන් | 15 - 19 |
| ආදායම් ප්‍රකාශය | 20 |
| ශේෂ පත්‍රය | 21 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 22 - 23 |
| මූල්‍ය වාර්තා සඳහා සටහන් | 24 - 33 |
| 2013 වසරේ මූල්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ විගණකාධිපතිතුමාගේ මතය | 34 - 41 |
| විගණකාධිපතිතුමාගේ වාර්තාවට පිළිතුරු 2013 | 42 - 46 |

## දැක්ම

රාජ්‍ය යාන්ත්‍රණයේ සංවර්ධන හා මෙහෙයුම් සහ සියලු ව්‍යාපාර ක්ෂේත්‍රයන්හි ප්‍රවර්ධනයන් නිර්මාණාත්මකව සන්නිවේදනය කිරීම තුළින් ප්‍රචාරණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වීම.

## මෙහෙවර

නිපුණත්වයෙන් හෙබි වඩාත් නිර්මාණශීලී හා දිරිමත් පුද්ගල සහය භාවිතා කරමින් උපක්‍රමශීලිත්ව මෙන්ම උසස් තලයේ තාක්ෂණයද නිර්මාණාත්මකව උපයෝගී කරගනිමින් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සඳහා සන්නිවේදන සහ වෙනත් නිර්මාණශීලී ප්‍රචාරාත්මක අනගි සේවාවක් සැපයීම තුළින් ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජීය සහ දේශපාලන සංවර්ධනය සඳහා සක්‍රීයව දායක වීම.

## අරමුණු

- මූල්‍ය තත්ත්වය ඉහළ දැමීම.
- වෙළඳපොල ලාභය ඉහළ දැමීම.
- සේවාලාභී සංතෘප්තිය ඉහළ දැමීම සඳහා වූ උපක්‍රම ක්‍රියාත්මක කිරීම.
- ආයතන සේවකයින් සහ නායකයින් වර්ධනය කිරීම.



**තුසිත ජයවර්ධන**
සභාපති
සැලසිනෙ රූපවාහිනී ආයතනය

## සභාපතිතුමාගේ සමාලෝචනය

සැලසිනෙ රූපවාහිනී ආයතනයේ සභාපති ධූරයට පත්වීමෙන් අනතුරුව ආයතනයේ විසින් එළිදක්වනු ලබන 2013 වාර්ෂික වාර්තාවට පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම මා ලත් භාග්‍යයක් ලෙස සලකමි.

පසුගිය තිස්තුන් වසරක කාලය තුළ විවිධ වූ දුෂ්කරතා මධ්‍යයේ ආයතනය පැමිණි ගමන් මඟෙහි සුවිශේෂී වූ වර්ෂයන් ද පසුකර ඇත. පරිපාලනය මෙන්ම ගිණුම්කරණයන්හි කාර්යක්ෂමතාවය පෙන්නුම් කල වාර්ෂික වාර්තා කීපයක්ම පසුගිය වසර කීපය තුළ එළිදක්වා ඇත.

සැලසිනෙ ආයතනයේ ගිණුම්කරණ කටයුතුවල නිවරදිතාවය මෙන්ම නියමිත ක්‍රමවේදයන්ට අනුව එකී ගිණුම් පිළියෙල කර තිබීම තුළ ආයතනය ඵලදායී ප්‍රතිඵල රාශියක් අත්කරගෙන තිබූ බව පසුගිය මූල්‍ය ප්‍රකාශන තුළින් පිළිබිඹු වී ඇත.
එනම් පසුගිය 2011 සහ 2012 වසරවල මූල්‍ය ප්‍රකාශන කෙරෙහි විගණකාධිපති මතය උසස් ලෙස සනිටුහන් කර තිබීම එයට කදිම නිදසුනකි.

පරිපාලන අංශයේ මෙහෙයවීම යටතේ මානව සම්පත් උපදේශන සේවාව මඟින් 2013 වසරේ දී දියත් කරනු ලැබූ වැඩසටහන් මඟින් සේවක මහත්ම මහත්මීන්ගේ සමූහ ක්‍රියාකාරකම්හි වර්ධනයක් ඇතිකරලීමට විශේෂිත වූ ප්‍රයත්නයක් දරා ඇති බව පැහැදිලි වේ.

වසර කිපයක් මුළුල්ලේ ලේක්හවුස් ආයතනයට වැඩිම දැන්වීම් ප්‍රමාණයක් ලබාදෙන ආයතනය ලෙස විරුදාවලිය ලැබීමට සැලසිනෙ ආයතනයට හැකිවූයේ ග්‍රැෆික් අංශය මඟින් නිර්මාණය කරනු ලබන සුවිශාල දැන්වීම් ප්‍රමාණය ඉතා කාර්යක්ෂම ලෙස උපලේඛනගත කිරීම් කරනු ලබන මාධ්‍ය අංශයේ ද අනගි සේවාව තුළින් බව ප්‍රකට වේ. 2013 වසර තුළදී ද එම තත්ත්වය පවත්වාගෙන යාමට එම දෙඅංශය විසින් කරන ලද සේවාව පැසසුම් කටයුතුය.

කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය හඳුන්වාදීමේ වෙළඳ දැන්වීම් ප්‍රචාරණය ඇතුළු විවිධ වූ වෙළඳ ප්‍රචාරණ නිෂ්පාදනය මෙන්ම රට විරුවෝ රියැලිටි වැඩසටහන ඇතුළු වෙනත් බොහෝ වාර්තාමය වැඩසටහන් නිෂ්පාදනය කිරීම තුළින් නිෂ්පාදන අංශය විසින් 2013 වසර වඩාත් සාර්ථක වසරක් ලෙස නිමාකර ඇත. පිටපත් රචනයේ සිට සංස්කරණ කාර්යාවලිය දක්වා වූ ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය නිෂ්පාදනය පිළිබඳව නිෂ්පාදන අංශය ලබා තිබෙන නිපුණත්වය පසුගිය වසර කීපය පුරාම දිස්විය.

2012 වසර හා සසඳන විට 2013 වසරේදී සැලසිනෙ ආයතනය ලබා තිබෙන ආදායම රු මිලියන 215 කින් වර්ධනය වී තිබේ. එය ප්‍රතිශතයක් ලෙස සැලකූවිට 67%ක වැඩිවීමකි. එසේම 2013 වසරේදී ඉලක්කගත ආදායම අභිභවා රු. මිලියන 653 කට අධික ආදායමක් ලබා තිබීම ද ඉතිහාසයේ ලැබූ වැඩිම ආදායම ලෙස ද සැලකිය හැක. මෙවන් වාර්තාගත ජයග්‍රහණ ලබාගැනීම සඳහා අලෙවි හා පාරිභෝගික සේවා අංශය විසින් කරනු ලැබූ කැප කිරීම් අනභිබවනීයයි.

මුළු රටම එක්සත්ව එක්සිත්ව පෙරට යන මොහොතක රජයට අයත් එකම ප්‍රචාරණ ආයතනය වන සැලසිනෙ රූපවාහිනී ආයතනයට ඉදිරියේ දී ලැබෙන කාර්යභාරය ද විශාලවනු ඇත. එවැනි අභියෝගාත්මක මෙහෙවරක් ඉටුකිරීම සඳහා අවශ්‍ය සාධක සපුරාගෙන අනාගත ඉලක්කවලට සාර්ථකව මුහුණදීමට අවශ්‍ය ශක්තිය හා ධෛර්යය ලඟාකර ගැනීම යුගයේ කාර්යභාරය වනු ඇත.

**තුසිත ජයවර්ධන**
**සභාපති**

සැලසිනෙ රූපවාහිනී ආයතනය
SELACINE
TELEVISION INSTITUTE

# පරිපාලන ව්‍යුහය - 2013

**ජ්‍යේෂ්ඨ කළමනාකාරීත්වය**

ප්‍රදීප් එදිරිසිංහ - සභාපති

රන්ජන් ඒකනායක - සාමාන්‍යාධිකාරී (වැ.බ.)

**කළමනාකරණය**

පුෂ්පා බමුණුආරච්චි - කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන)

සුනන්ද වීරසිංහ - කළමනාකරු (නිෂ්පාදන)

ධම්මික පීරසිංහ - පාරිභෝගික සේවා අධ්‍යක්ෂ

නලීන් අලහකෝන් - කළමනාකරු (මාධ්‍ය)

කේ. ඩී. ජේ. ද ලාසාල් - කළමනාකරු (මූල්‍ය)

සුජිත් පුෂ්පකුමාර - කළමනාකරු (වැ.බ.) (ග්‍රැෆික්)

**විගණක**

රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව

**බැංකුකරුවන්**

ලංකා බැංකුව

# සම්බන්ධීකරණ තොරතුරු


**ලිපිනය**

ශ්‍රවන් විදුලි සංස්ථා අභ්‍යාස ගොඩනැගිල්ල, නිදහස් චතුරස්‍රය, කොළඹ 07

**දුරකථනය**

011 2688744 /011 5767979/ 011 5235480

**ෆැක්ස්**

011 2688745

**විද්‍යුත් තැපෑල**

selacine@gmail.com

**වෙබ් අඩවිය**

www.selacine.lk

# ආයතනික තොරතුරු

**නාමය** : සැලසිනෙ රූපවාහිනී ආයතනය

**නීතිමය ස්වරූපය හා අතීත කාර්ය ස්වභාවය :**

- 1982 පෙබරවාරි 01 දින සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ අධිකාරිත්වය යටතේ ආරම්භ විය.
- 1982-1989 දක්වා ඉඩම්, වාරිමාර්ග හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය යටතේ වූ රාජ්‍ය දැව සංස්ථාවේ මානව හා මූල්‍ය සම්පත් යටතේ මහවැලි කඩිනම් සංවර්ධන වැඩසටහන පිළිබඳ ශ්‍රී ලාංකීය ජනතාව දැනුවත් කිරීමේ කාර්යය සිදුකිරීම.
- 1989 ජනසවිය වැඩසටහනේ ප්‍රචාරාත්මක කාර්යභාරය සිදුකිරීම
- 1989.08.19 දිනැති අංක 832/15 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් සැලසිනෙ ආයතනය යෞවන කටයුතු, ක්‍රීඩා හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය යටතට පවරන ලදී. (මෙය ආයතනය සම්බන්ධව ගැසට් නිවිදනයක් මගින් කරනු ලැබූ පළමු පැවරීමයි)
- 1997.06.09 දිනැති අංක 979/2 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් තැපැල්, විදුලි සංදේශ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත පවරන ලදී.
- 2001. 12. 20 දිනැති 1215/14 දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව ජනසන්නිවේදන අමාත්‍යාංශය යටතට පවරාගන්නා ලදී.
- 2004. 04. 28 දිනැති 1338/9 දරන අති විශේෂ ගැසට් නිවේදනය තුළින් තොරතුරු හා මාධ්‍ය අමාත්‍යාංශයට අයත් ආයතනයක් ලෙස නම් කරනු ලැබීය.
- 2005/12/08 දිනැති 1422/22 දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශයට අයත් ආයතනයක් ලෙස ස්ථාපිත කරනු ලැබීය.
- 2007 අංක 07 දරන සමාගම් පනතෙහි විධිවිධානයන්ට අනුව පූර්ණ අයිතිය රජයට හිමි පොදු සමාගමක් බවට පත්කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත 2008. 03. 26 දිනැති සන්දේශය ඉදිරිපත් කෙරුණි.

**ආයතනික කාර්ය භාරය :**

- රජයේ මාධ්‍ය ප්‍රචාරණ හා නිෂ්පාදන ආයතනය ලෙස ක්‍රියාත්මක වීම.
- 2005. 05. 16 දින අංක 1380/15 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් පහත සඳහන් කරුණු කාර්ය විෂය පථයට ඇතුලත් කෙරුණි.
  - i මුද්‍රිත / විද්‍යුත් මාධ්‍ය දැන්වීම් නිෂ්පාදනය
  - ii රජයේ සංවර්ධන ක්‍රියාදාමයන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ ප්‍රචාරක කටයුතු
  - iii රජයේ ප්‍රචාරක වැඩසටහන් නිෂ්පාදනය
- 2008. 12. 02 දිනැති ජනමාධ්‍ය හා තොරතුරු ගරු අමාත්‍යතුමාගේ සංදේශය සම්බන්ධ නිරීක්ෂණයෙන් අනතුරුව 2008. 12. 24 දිනැති අංක 08/2253/338/043 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් සියලුම අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති ආයතනවල සියලුම වෙළෙඳ දැන්වීම් හා ප්‍රචාරාත්මක වැඩසටහන් සැලසිනෙ රූපවාහිනී ආයතනය මගින් ඉටුකරවා ගැනීම අනිවාර්ය කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී.
- රූපවාහිනී වාර්තාමය වැඩසටහන්, ගුවන් විදුලි වැඩසටහන් මෙන්ම රූපවාහිනී හා ගුවන් විදුලි වෙළෙඳ දැන්වීම් යනාදී ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණයන් නිෂ්පාදනය කිරීම
- විවිධ වූ පුවත්පත් දැන්වීම් නිර්මාණය මෙන්ම එම දැන්වීම් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන්හි උපලේඛනගත කිරීම.
- ඉසව් කළමනාකරණය හා මුද්‍රණ කටයුතු

# නිර්මාණ සහ ග්‍රැෆික් අංශය

සැලසිනෙ රූපවාහිනී ආයතනය විසින් එයට අයත් අංශයන්හි කාර්යක්‍ෂමතාවය ඇගයීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරවීමෙන් පසු ප්‍රථම වතාවට ආයතනයේ විශිෂ්ඨතම කාර්යසාධන අංශය ලෙස 2011 වසරේ දී කිරුළු පැළැඳු වූයේ නිර්මාණ හා ග්‍රැෆික් අංශයට ය. ඉන් අනතුරුව එය ක්‍රියාත්මක වූ 2013 වසරේ දී ද පිටපිටම දෙවන වතාවටත් කාර්යක්‍ෂම අංශය ලෙස නිර්මාණ සහ ග්‍රැෆික් අංශය පිදුම් ලැබුවා ය.

පළපුරුදු වෘත්තීය ග්‍රැෆික් නිර්මාණකරුවන් පිරිසකගෙන් සමන්විත මෙම අංශය ඕනෑම හදිසි කාර්යයන් සඳහා නිතර සූදානමින් සිටින අංශයකි. වේලාව අවේලාව කෙරෙහි තැකීමකින් තොරව එම වෘත්තිකයෝ තම කාර්යභාරය නොපිරිහෙලා ඉටුකිරීමට වගබලා ගනිති.

පුවත්පත් දැන්වීම් නිර්මාණකරණය, ත්‍රිමාණකරණය, ත්‍රිමාණ සජීවිකරණය, පෝස්ටර් සහ බැනර් ඇතුළු විවිධ වූ ප්‍රකාශයන් හි නිර්මාණ කේන්ද්‍රස්ථානය වනුයේ නිර්මාණ සහ ග්‍රැෆික් අංශයයි. මෙම අංශයේ නිර්මාණ කෙරෙහි තෘප්තිමත් වන සේවාදායකයින්ගෙන් සෘජු ලෙස ලැබෙන පැසසුම් ද බොහෝ ය.

ලේක්හවුස් ආයතනය වෙත ලැබෙන දෛනික පුවත්පත් දැන්වීම් අතුරින් වැඩිම පුවත්පත් දැන්වීම් ප්‍රමාණයක් ලබාදෙන ආයතනය වන සැලසිනෙ ආයතනය එහි වගකීම පවරා දී තිබෙනුයේ නිර්මාණ සහ ග්‍රැෆික් අංශය වෙතයි. එම වගකීම නිසි ලෙස ඉටුකරන ග්‍රැෆික් අංශය ඉතා නිවැරදිව හා නියමිත කාලය තුළ එකී නිර්මාණයන් සම්පූර්ණකර පුවත්පත් ආයතන වෙත යැවීම සඳහා අදාළ අංශ වෙත භාරදෙනු ලබයි.

එවන් ආකාරයට තම අංශයේ නිර්මාණකරණ හැකියාව වඩාත් තීව්‍ර කරමින් එහි කාර්යක්‍ෂමතාවය ද වසරින් වසර වැඩිදියුණු කරගනිමින් 2013 වසර ද ඉතා සාර්ථක ලෙස අවසන්කර තිබේ.

## මාධ්‍ය අංශය

මාධ්‍ය අංශයේ ප්‍රධානතම කාර්යභාරය වන විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන්හි දැන්වීම් හා ශ්‍රව්‍ය දෘශ්‍ය නිපැයුම් උපලේඛනගත කිරීම 2013 වසර තුළ දී වඩාත් කාර්යක්ෂම ලෙස සිදුකරන ලදී. දැන්වීම් පලවීම සම්බන්ධව මෙන්ම රූපවාහිනී හා ගුවන් විදුලි විකාශනයන්හි පසුවිපරම් සිදුකිරීම ද එම අංශයේ දෛනික කාර්යයක් බවට පත්ව ඇත.

2013 වසර තුළදී ලේක්හවුස් පුවත්පත් ආයතනය වෙත ලැබුණු දැන්වීම් අතරින් වැඩිම දැන්වීම් ප්‍රමාණයක් උපලේඛගතකර තිබෙනුගේ සැලසිනෙ මාධ්‍ය අංශය විසිනි.

සැලසිනෙ ආයතනය ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ දැන්වීම් ප්‍රචාරණ ආයතනයක් ලෙස එයින් පිළිබිඹු වේ. මාධ්‍ය නිෂ්පාදනය පමණක් නොව දැන්වීම් නිර්මාණය පිළිබඳව ඉහළ මට්ටමේ හැකියාවක් සැලසිනෙ ආයතනය සතු බව මෙයින් පෙන්නුම් කෙරේ.

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අනුග්‍රහය මත ජනතාව දැනුවත් කිරීමේ මාධ්‍ය සාකච්ඡා, පුවත්පත් දැන්වීම්, රූපවාහිනී ප්‍රචාරක වැඩසටහන් සහ ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය අනුග්‍රහය මත 2013 වසරේ පොදු රාජ්‍ය මණ්ඩලීය සමුළුව වෙනුවෙන් ඉදිරිපත් කළ පුවත්පත් දැන්වීම් මාලාව ජනතාව අතර වඩාත් ප්‍රසාදයට පත්විය.

# අලෙවි සහ පාරිභෝගික සේවා අංශය

පසුගිය වසර තුළ අලෙවි ප්‍රවර්ධනාත්මය වැඩසටහන් කීපයක් ක්‍රියාත්මක කිරීම තුළින් මහඟු ප්‍රතිඵල රාශියක් ළඟා කරගත් අලෙවි හා පරිභෝගික සේවා අංශය, 2013 වසරේදි තම කාර්යභාරය ආරම්භ කරනු ලැබයේ වාර්ෂික ආදායම රුː මිලියන 650 ක ඉලක්කයක් කරා හඹා යෑමේ අරමුණෙනි.

පළපුරුදු අලෙවි නිලධාරින්ගෙන් සහ නවක නිලධාරින් ගෙන් ද සමන්විත බල ඇණියක් ලෙස හැඳින්විය හැකි අලෙවි අංශයේ ක්‍රියාකාරිත්වය කැපීපෙනෙන ලෙස ඉහළ මට්ටමක තිබුණි. සමාන්‍යධිකාරිතුමා ඇතුළු ඉහළ නිලධාරින්ගේ දැඩි සුපරික්ෂණය යටතේ ක්‍රියාත්මක වු අලෙවි සේවා අංශය 2013 වසරේදි ඉලක්කගත ආදායමට වැඩියෙන් එනම් රුː මිලියන 653 කට අධික ආදායමක් ලබාගැනීමට සමත් විය.

ඉහළ ඉලක්කයක් කරා හඹායාමේදි අලෙවි අංශය අත්කරගත් ප්‍රගතිය ප්‍රසංශනීයයි. ඇතැම් නිලධාරීන්ට අන්තර්ජාල සහ විද්‍යුත් තැපෑල පිලිබඳ එක්දින පුහුණු වැඩසටහන්වලට යොමුකරන ලද අතර "මනා අලෙවි හැඩගැස්මක් තුලින් සුහද පාරිභෝගික සේවාවක්" නමින් විශේෂ පුහුණු වැඩසටහනක් වෙත යොමුකරන ලද අතර අලෙවි අංශයේ සියලු නිලධාරීන් වෙනුවෙන් පවත්වනු ලැබීය.

## මානව සම්පත් හා පරිපාලන අංශය

සැලසිනෙ රූපවාහිනී ආයතනයේ කේන්ද්‍රස්ථානය වැනි වූ මානව සම්පත් හා පරිපාලන අංශය 2013 වර්ෂය තුළදී ගුණාත්මක ප්‍රගමනයක් පෙන්නුම් කරන ලදී. අප ආයතනයේ මානව සම්පත උසස් තලයක පිහිටුවීම අරමුණු කොටගෙන මෙම වසරේදී මානව සම්පත් හාපරිපාලන අංශය මඟින් සේවා සහ ක්‍රියාකාරකම් රැසක් සිදු කෙරිණි. ආයතනය සතු විශාලතම සම්පත වන මානව සම්පත තුළ චින්තනමය හා හැකියාවන් වර්ධනය උදෙසා බාහිර උපදේශන සේවාවක් ක්‍රියාත්මක කෙරිණි. ඒ තුළින් සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමට හැකියාව ලැබුණි. සේවක ඵලදායිතාව වර්ධනය කිරීම සඳහා විවිධ ශිල්පීය ක්‍රම භාවිතා කිරීම ද මාවන සම්පත් හා පරිපාලන අංශයේ සුවිශේෂී ලක්ෂණයක් විය. ඒ අනුව සේවකයන්ගේ අභිවෘද්ධිය හා සුබ සාධනය ඉහළ මට්ටමකට රැගෙන යාමට ඔවුන්ට අවශ්‍ය ණය පහසුකම්, ප්‍රසාද දීමනා මෙන්ම උත්සව සමයේදී තෑගි වව්චර් ද පිරිනමන ලදී. රාජ්‍ය චක්‍රලේඛ ආදේශ කරගනිමින් වඩාත් කාර්යක්ෂම ලෙස සේවකයින්ට අවශ්‍ය පුහුණු පාඨමාලාවන් සඳහා ඔවුන්ව යොමුකරනු ලැබීය.

සේවකයින්ට තම රාජකාරී පහසුවෙන් ඉටු කිරීමට අවශ්‍ය කාර්යාලීය උපකරණ මෙන්ම තාක්ෂණික උපකරණ ලබා දීමට මානව සම්පත් හා පරිපාලන අංශය කඩිනම් පියවර ගන්නා ලදී. එමෙන්ම වාහන මිල දී ගැනීම් ආදියට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ද විධිමත් හා කාර්යක්ෂමව සිදු කෙරුණු අතර ප්‍රවාහනයට අදාළ සියලු කාර්යයන් සිදු කරනුයේ මානව සම්පත් හා පරිපාලන අංශය මඟිනි.

ආයතනික රාජකාරි නිසි ලෙස ඉටු කිරීම සඳහා සේවකයින්ට අවශ්‍ය සහන ලබා දීමට ද මෙම අංශය කටයුතු කර ඇත. ඒ අනුව සේවකයින් රාජකාරියට පැමිණීම දිරිගැන්වීම උදෙසා මාසික නිවාඩු දීමනාවක් ලබා ගැනීමට සේවකයින්ට අවස්ථාව ලබා දුනි.

සේවක චින්තනය හා අභිප්‍රේරණයේ ගුණාත්මක වර්ධනයක් අපේක්ෂා කරමින් ප්‍රියසාද, කලා හා ආගමික කටයුතු සඳහා අනුග්‍රහය දැක්වීම ද මානව සම්පත් හා පරිපාලන අංශය මගින් සිදු කෙරිණි.

එමෙන්ම සේවකයින්ගේ ඒකාකාරී ජීවන රටාවෙන් මිදී විනෝදය, සතුට තුළින්අරමුණක් වෙත හඹා යාමේ ජවය ස්වකයින්ට ප්‍රායෝගිකව ලබා දීමට ක්‍රියාත්මක කරනු ලැබූ Gung Ho වැඩසටහන ද මානව සම්පත් හා පරිපාලන අංශය විසින් සංවිධානය කරනලැබූ අතර එය සැලසිනෙ රූපවාහිනි ආයතනයේ සේවකයින්ගේ ප්‍රසාදයට ලක් වූ සුවිශේෂී වැඩසටහනක් ලෙස හඳුන්වාදිය හැකිය. 2013 වර්ෂයේ මෙන්ම ඉදිරියටත් මානව සම්පතගේ අභිවෘද්ධිය හා සුබ සාධනය උදෙසා මානව හා පරිපාලන අංශය සැම විටම ඇප කැප වී සිටියි.

## නිෂ්පාදන අංශය

නිර්මාණශීලි ශ්‍රව්‍ය දෘශ්‍ය නිෂ්පාදන කාර්යයන්ට අදාළ සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමේ වගකීම මැනවින් ඉටු කරමින් සැලසිනෙ රූපවාහිනි ආයතනයේ නිෂ්පාදන අංශය 2013 වර්ෂයේදී විශාල ප්‍රගතියක් අත්කර ගැනීමට සමත් විය. එහිදී රූපවාහිනි වාර්තාමය වැඩසටහන්,ගුවන් විදුලි සහ රූපවාහිනි දැන්වීම් මෙන්ම විවිධ ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය නිෂ්පාදන රැසක් මෙම අංශය මගින් සිදු කරනු ලැබීය.

මාධ්‍ය නිෂ්පාදනයක පිටපත් රචනයේ සිට එය සංස්කරණය කොට නිමා කිරීම දක්වාම කාර්යයශූර නිර්මාණශීලි සේවක පිරිසකගෙන් සමන්විත නිෂ්පාදන අංශය විසින් 2013 වර්ෂයේදී සියයකට අධික මාධ්‍ය නිෂ්පාදන  රැසක් සාර්ථක ලෙස නිම කරන ලදී. ඒ අතර “රට විරුවෝ රියැලිටි වැඩසටහන” ,“ආපදා කළමනාකරණ වාර්තා වැඩසටහන”, “තැපැල් සේවය පිළිබඳ වාර්තා වැඩසටහන”, “කොළඹ කටුනායක අධිවේගී මාර්ගය හඳුන්වා දීමේ රූපවාහිනී වෙළඳ දැන්වීම්” මෙන්ම  “වැවක මහිම බල ජල කඳ පිරීලා” වාර්තා වැඩසටහන 2013 වර්ෂයේ වඩාත් ආකර්ෂණීය ලෙස ප්‍රසාදය දිනා ගත් මාධ්‍ය නිෂ්පාදන කාර්යයන් අතර වේ.

දිනෙන් දින දියුණු වන තාක්ෂණය සමඟ සම්බන්ධ වී අධිතාක්ෂණ කැමරා උපකරණ සහ සංස්කරණ මැදිරි භාවිතා කර නිර්මාණශීලි මාධ්‍ය නිෂ්පාදනයන්හි යෙදුණු නිෂ්පාදන අංශයේ සේවක පිරිස ඒ ඒ අංශයන්ට අදාළ පුහුණු පාඨමාලාවන්ට සහභාගි වී එම දැනුම අත්පත් කර ගෙන ඇත.

නිර්මාණශීලි හැකියාවන් තවදුරටත් ඔප් නංවා ගනිමින්, නව තාක්ෂණය උපයෝගී කර ගනිමින් ඉදිරියටත් සාර්ථක අන්දමින් මාධ්‍ය නිෂ්පාදන කාර්යයන්හි නියැලීම අපගේ බලාපොරොත්තුවයි.

## මූල්‍ය අංශය

පසුගිය වසරේදී නව විධික්‍රම හඳුන්වාදීමෙන් අනතුරුව ඇරඹි මූල්‍ය කාර්යක්ෂමතාවය 2013 වසරේදී ද වඩාත් හොඳින් ක්‍රියාත්මක විය. රජයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සියලු ගිණුම් කටයුතු ක්‍රමවත්ව සිදුකෙරුණි. හිඟ මුදල් අයකර ගැනීම සඳහා විශේෂ සැලැස්මක් ක්‍රියාත්මක කර එමඟින් විපුල ප්‍රයෝජන අත්කරගැනීමට මෙම අංශය සමත්විය.

අභ්‍යන්තර විගණන අංශය පිහිටුවීම තුළින් මෙම වසරේදී ද ගිණුම් කටයුතු වඩාත් නිරවුල් විය. අනෙකුත් අංශ සමඟ කෙරෙන ලිපිගනු-දෙනු වඩාත් කාර්යක්ෂම අයුරින් මෙම 2013 වසරේදී ද ක්‍රියාත්මක විය.


ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණයේ ප්‍රමිති ක්‍රියාත්මකවීම දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණය වෙනුවෙන් ගිණුම් අංශයේ නිලධාරීන් ද සහභාගිවීම තුළින් එම නිලධාරීන්හට එහි දැනුවත්භාවය වර්ධනය කර ගැනීමට හැකිවිය.

2012 වසරේදි මෙන්ම 2013 වසරේදී ද මූල්‍ය ප්‍රකාශනය විධිමත් අයුරින් සකස් කෙරුණි. විගණකාධිපති වාර්තාව මඟින් මූල්‍ය තත්ත්වය සහ 2013. 12. 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එකී මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බවට විගණකාධිපති මතය ප්‍රකාශ වී ඇත.


මෙමගින් මූල්‍ය අංශයේ විසින් කරනු ලබන ගිණුම්කරණයන්හි නිවැරදිතාවය හා කාර්යක්ෂමතාවය වඩාත් හොඳින් පිළිබිඹු වේ.

# මූල්‍ය වාර්තා 2013


## ආදායම් වර්ධනය




## පසුගිය වසර පහ තුළ ආදායම් සහ වියදම



### 2009- 2013 වසරයන් අතර ආයතනික ලාභයේ උපනතිය



**2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා**

**ගිණුම් ප්‍රතිපත්ති**

**1. පොදු කරුණු**

**1.1 සංයුක්ත තොරතුරු**

සැලසිනෙ රූපවාහිනී ආයතනය (මින් පසු සැලසිනෙ නාමයෙන්, හැඳින්වෙන) 2005-12-08 දිනැති අංක 1422/22 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශයෙහි විෂය පථයට ඇතුළත් කෙරිණි.

**1.2 මූලික කාර්යයන් සහ මෙහෙයුම් ස්වභාවය**

ප්‍රචාරණය, රූපවාහිනී සහ ගුවන් විදුලි වැඩසටහන් මෙන්ම ඉසව් කළමනාකරණය සැලසිනෙහි මූලික කාර්යයන් අතර ප්‍රධාන තැනක් ගනී.

**1.3 සේවක ප්‍රමාණය**

2013-12-31 දින වන විට ස්ථිර සේවකයින් 14ක් සහ කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයින් 41ක් සිට ඇත.

**2. ගිණුම් ප්‍රතිපත්ති පිළිබඳව සුවිශේෂී කරුණුවල සංක්ෂිප්තය**

**2.1 පොදු ප්‍රතිපත්ති**

මෙම මූල්‍ය ප්‍රකාශයන් සකස් කර ඇත්තේ පොදුවේ පිළිගත් ගිණුම් ප්‍රතිපත්ති සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ මඟ පෙන්වීම යටතේ පවත්නා ශ්‍රී ලංකා ගිණුම් ප්‍රතිපත්ති වලට අනුකූලවය.
දැනට පවත්නා පදනම සැලකීමට භාජනය කර ශ්‍රී ලංකා රුපියල් වලින් මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කර ඇත.

**2.2 ස්ථායිතාවය සහ සැසැඳුම්**

මෙම වසර සඳහා යොදා ගන්නා ලද ගිණුම් ප්‍රතිපත්ති පසුගිය වසරේ දී යොදාගත් ප්‍රතිපත්ති සමග අනුකූල වේ.

**2.3 ණය පිරිවැය**

මෙහි ණය පිරිවැය හඳුනාගෙන ඇත්තේ අදාළ ගිණුම් කාලය තුළ දරන ලද වියදම් ලෙසය.

**3. වත්කම් තක්සේරුව සහ එහි අගයුම් පදනම**

**3.1 දේපළ, පිරියත සහ උපකරණ**

පිරිවැය හෝ ප්‍රත්‍යගණන ගණනය මත දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳ වාර්තා කර ඇත.

**3.2 වෙළඳ හා ලැබිය යුතු වෙනත් දෑ**

වෙළඳ හා ලැබිය යුතු වෙනත් දෑ ඇස්තමේන්තු කළ උපලබ්ධි අගය මත සඳහන් කර ඇත.

**3.3 වෙළඳ සහ අනෙකුත් ගෙවීම**

මූල්‍ය ප්‍රකාශනයේ දැක්වෙන පරිදි 2011 සිට අද දින දක්වා නොගෙවනු ලැබූ බදු මුදල් ස්ථිර තැන්පත් හි තැන්පත් කර ඇත. සමාගම් පනත යටතේ සැලසිනෙ සංස්ථාපිතයන්ට අනුව අදාළ කාල පරිච්ඡේදයට අදාළව මුළු මුදල ගෙවා ඇත. 2011 ට පෙර වසරයන් සඳහා දේශීය ආදායම් වෙතින් ණය සහන ඉල්ලා සිටීමේ සාකච්ඡා දැනට පැවැත්වේ.

**3.4 මුදල් සහ මුදල් සමාන දෑ**

මුදල් සහ මුදල් සමාන දෑ සඳහා අතේ ඇති මුදල් සහ බැංකු වල ඇති ඉල්ලුම් තැන්පතු ඇතුළත් වේ.

**3.5 කල්බදු වත්කම්**

කල්බදු පිළිබඳ නියමයන් හි දි අයිතිය දැක්වෙන සියලු අවදානම් සහ පාරිතෝෂිකයන් මූල්‍ය කල්බදු ලෙස වර්ගීකරණය කිරීම සැලසිනෙ උපකල්පනය කරයි. කල්බදු පිළිබඳ මූලික හඳුන්වා දීමේදී එහි අවම කල්බදු ගෙවීමේ දී එහි සාධාරණ අගයේ සහ වර්තමාන අගයන් ට වඩා අඩු සමානත්වයක් ගණනය කිරීමේ දී සිදුවේ. මූලික හැඳින්වීමෙන් අනතුරුව වත්කම් සඳහා යොදා තිබෙන ගිණුම් ප්‍රතිපත්තීන්ට අනුකූලව වත්කම් ගණනය කරනු ලැබීය.

**3.6 ක්ෂය කිරීම්**

ආදායම් ප්‍රකාශය තුළ ක්ෂය වීම් ලෙස හඳුන්වනු ලැබුණේ ප්‍රයෝජනයට ගත හැකි යැයි ඇස්තමේන්තු ගත කර තිබෙන වත්කම් පදනම් කරගත් සරල මාර්ග ක්‍රමය යොදා ගනිමිනි. මූල්‍ය කල්බදු යටතේ පවතින කෙටිකාලීන හා ප්‍රයෝජනයට ගත හැකි සමාන වටිනාකම් සහිත වත්කම් මත ක්ෂය කිරීම් සිදුකර ඇත.

දේපල පිරියත හා උපකරණ අයිතමයන්ගේ ක්ෂය අනුපාතයන් පහත දැක්වේ.

| | |
|---|---|
| ලී බඩු සහ සවිකිරීම් | වර්ෂ 2-10 |
| පරිගණක උපාංග | වර්ෂ 3-5 |
| කාර්යාලීය උපකරණ | වර්ෂ 10 |
| මෝටර් වාහන | වර්ෂ 5 |
| කැමරා උපකරණ | වර්ෂ 10 |
| ගිණුම්කරණ මෘදුකාංග | වර්ෂ 10 |

**4 වගකීම් සහ ප්‍රතිපාදන**

**4.1** ශේෂ පත්‍ර දින සිට වසරක කාලයක් තුළ ඉල්ලුම මත ගෙවීමට ඇති ජංගම වගකීම් ශේෂ පත්‍රයෙහි වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත. ශේෂ පත්‍ර දින සිට වසරක කාලයකට පසුව ගෙවීමට නියමිත වගකීම් දීර්ඝ කාලීන වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත.

**4.2 විශ්‍රාම පාරිතෝෂික දීමනා**

සේවක ප්‍රතිලාභ - SLAS 16 ( සංශෝධිත 2006) විධිවිධානයන් යටතේ සියලු සේවකයන්ගේ විශ්‍රාමික ප්‍රතිලාභ සේවයේ පළමු වසරේ සිටම ප්‍රතිපාදනය කර ඇත.

1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා පනතට අනුකූලව ඒ යටතේ වසර 5 ක් එක දිගට පවත්වාගෙන ගොස් සේවය අවසන් කරන්නා වූ සේවකයින් සඳහා වන වගකීමක් ලෙස ප්‍රතිපාදන වෙන් කර ඇත.

**4.3 අර්ථ දැක්වූ දායකත්ව සැලසුම් - සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරාර අරමුදල**

සේවය අවසන් කළ සේවකයන් සඳහා ප්‍රතිලාභ සැලසුමක් ලෙස යම්කිසි අයතනයක් මගින් තවත් ආයතනයකට ගෙවන්නා වූ ස්ථිර දායකත්වයක් හැර තවදුරටත් වෙනත් ගෙවීමක් කිරීමට නෛතික හෝ අර්ථකාරී බැඳීමක් නොමැති සේවක ප්‍රතිලාභ සැලසුමක් අර්ථ දැක්වූ දායකත්ව සැලසුමක් වේ. සියලුම සේවකයින් ආවරණය කරන පරිදි අර්ථසාධක හා භාරකාර අරමුදල් සඳහා දායකත්වය සැලසීමට ඇති බැඳීමකින් කරන ගෙවීම් ලාභ/අලාභ ගිණුම සඳහා වියදමක් ලෙස විය කරන්නා වූ අවස්ථාවේදීම හඳුන්වනු ලැබේ. සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල සඳහා අදාළ නීති හා රෙගුලාසි වලට අනුකූලව සේවායෝජකයාගේ දායකත්වය ලැබීමට සේවකයින් සුදුසුකම් ලබයි.

සේවක දල වැටුපෙන් 15%ක් හා 3%ක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදල් වෙත සැලසිනෙ දායකත්වය ලබා දෙයි.

**5. ආදායම් ප්‍රකාශය**

**5.1 පිරිවැටුම**

සැලසිනෙහි පිරිවැටුම ග්‍රැෆික් චිත්‍ර නිර්මාණ, උපලේඛනගත කිරීම්, ඉසව් කළමනාකරණය සහ රූපවාහිනී සහ ගුවන් විදුලි වැඩසටහන් නිෂ්පාදනය තුළින් ලැබේ.

**5.2 අදායම් හඳුනා ගැනීම**

ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුළට ගලා එන බවට සහ ඒ තුළින් විශ්වාසීව ස්ථිර ලෙස ආදායම් ගණනය කළ හැකි ලෙස ආදායම් ඉපැයීම අදායම් ලෙස හඳුනා ගැනේ.

**5.3 වියදම් හඳුනා ගැනීම**

ආදායම් ප්‍රකාශනයෙහි වියදම් හඳුනාගෙන ඇත්තේ දරන ලද පිරිවැය සහ විශේෂිත වූ ආදායම් අයිතමයන්හි ඉපැයීම් අතර ඍජු සම්බන්ධතාවයෙහි පදනම මතය.

**6. අදාළ පාර්ශව අතර ගනුදෙනු**

ගිණුම් ප්‍රකාශනයෙහි සඳහන් කාලය තුළ අදාළ පාර්ශව අතර ගනුදෙනු කිසිවක් සිදු කර නොමැත.

**7. ශේෂ පත්‍රයට පසු ගැළපුම් සටහන්**

මූල්‍ය වාර්තාවෙහි හෙළිදරව් කළ යුතු හෝ ගැළපීම් කළ යුතු ප්‍රමාණාත්මක සිදුවීම් ශේෂ පත්‍ර දිනට පසු සිදු වී නොමැත.

**8.** ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් පරිදි ප්‍රමුඛ බැංකුවේ පැවති රු. 300,000ක තැන්පතුව, ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ ගිණුමට මාරු කර ඇත.

**9,** 2011 වර්ෂයෙ ණයගැති ලේඛණයෙන් කපාහැරීම්, සම්මුච්ත ලාභයට ගලපා නිවැරදි කර ඇත.

**10.** ණය ගැතියෝ සඳහා අඩමාන ණය ලෙස 2.5% වෙන් කර තිබේ.

සැලසිනෙ රූපවාහිනී ආයතනය
SELACINE
TELEVISION INSTITUTE

# ආදායම් ප්‍රකාශය

**2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා**

**ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී**

| | සටහන් | 2013 | 2012 | 2011 |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| ආදායම් | 11 | 653,114,762 | 437,939,421 | 380,317,637 |
| අඩු කළා : | | | | |
| සෘජු පිරිවැය | 12 | 600,839,303 | 372,938,887 | 341,854,183 |
| දළ ලාභය | | 52,305,459 | 65,000,534 | 38,463,454 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 13 | 4,932,810 | 810,873 | 313,930 |
| | | 57,238,270 | 65,811,407 | 38,777,384 |
| අඩු කළා : | | | | |
| බෙදාහැරීමේ වියදම් | 14 | 4,078,809 | 7,392,272 | 3,440,965 |
| පරිපාලන වියදම් | 15 | 32,263,970 | 26,169,495 | 22,718,447 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 16 | 2,023,715 | 1,449,410 | 89,373 |
| බොල් හා අඩමාන ණය | | 1,362,910 | 6,219,283 | 2,282,976 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් මත ලාභය | - | 17,508,866 | 24,580,948 | 10,245,624 |
| අඩු කළා : | | | | |
| ක්ෂය වීම් | | 3,655,509 | 1,934,578 | 2,244,276 |
| | | 13,853,357 | 22,646,370 | 8,001,348 |
| අඩු කළා : | | | | |
| මූල්‍ය පිරිවැය | 17 | 642,617 | 1,208,428 | 462,113 |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය/(අලාභය) | | 13,210,740 | 21,437,942 | 7,539,235 |

# ශේෂ පත්‍රය

**දෙසැම්බර් මස 31 දිනට** — **ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී**

| | | 2013 | 2012 | 2011 |
|---|---|---|---|---|
| **වත්කම්** | **සටහන්** | **රු.** | **රු.** | **රු.** |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 18 | 19,985,876 | 20,144,197 | 7,093,233 |
| ස්ථාවර තැන්පතු | 19 | 62,713,488 | 20,800,000 | 800,000 |
| | | 82,699,364 | 40,944,197 | 7,893,233 |
| **ජංගම වත්කම්** | | | | |
| වෙළඳ හා ලැබිය යුතු වෙනත් වත්කම් | 20 | 311,839,772 | 131,503,883 | 136,875,538 |
| තැන්පතු හා පෙර ගෙවුම් | 21 | 65,000 | 100,000 | 3,121,440 |
| මුදල් හා මුදල් සමාන දෑ | 22 | 25,606,496 | 45,554,440 | 34,121,116 |
| | | 337,511,268 | 177,158,323 | 144,118,094 |
| **මුළු වත්කම්** | | 420,210,632 | 218,102,520 | 182,011,328 |
| **ස්කන්ධය හා වගකීම්** | | | | |
| ප්‍රාග්ධනය හා සංචිත | | | | |
| සමුච්චිත ලාභය / (අලාභය) | 23 | 35,066.158 | 26,194,953 | 9,100,002 |
| | | 35,066,158 | | |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| රාජ්‍ය ආයතන සැපයු අරමුදල් | 24 | - | - | 1,344,176 |
| ගෙවිය යුතු පාරිතෝෂික දීමනා | 25 | 4,430,648 | 4,053,061 | 3,516,376 |
| කල්බදු ණය | 26 | 612,726 | 1,375,041 | 1,986,497 |
| මහාභාණ්ඩාගාර ණය | | 5,580,000 | 9,300,000 | - |
| | | 10,623,374 | 14,728,102 | |
| **ජංගම වගකීම්** | | | | |
| වෙළඳ හා ගෙවිය යුතු වෙනත් වියදම් | 27 | 372,531,547 | 177,053,214 | 164,307,848 |
| අත්තිකාරම් ලැබීම් | | 129,552 | 126,252 | 1,756,429 |
| මහාභාණ්ඩාගාර ණය | | 1,860,000 | - | 182,011,328 |
| **මුළු වගකීම්** | | 374,521,099 | 177,179,466 | |
| **මුළු ස්කන්ධය හා වගකීම්** | | 420,210,632 | 191,907,568 | |

සත්‍ය බවට අධ්‍යක්ෂකවරු විසින් සහතික
කරන ලදී:
අත්සන් කළේ,

**සභාපති**
**සැලසිනෙ රූපවාහිනී ආයතනය**

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2013 | 2012 |
|---|---|---|
| **ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී** | **රු.** | **රු.** |
| **මෙහෙයුම් කටයුතු වලින් මුදල් ප්‍රවාහයන්** | | |
| ආදායම් බද්දට පෙර ශුද්ධ ලාභය | 13,210,740 | 21,437,942.00 |
| **ගැළපීම :** | | |
| පොළී වියදම් | 175,005 | 343,497.00 |
| පොළී ආදායම් | (4,757,611) | (717,885.00) |
| දේපල පිරියත් හා උපකරණ මත ක්ෂය වෙන් කිරීම | 3,655,509 | 1,934,578.00 |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම | 599,328 | 745,953.00 |
| අඩමාන ණය සඳහා වෙන්කිරීම | - | 2,937,883.00 |
| සමුච්චිත අරමුදලට පසුගිය වසරේ ගැලපීම් | (4,339,534) | (4,342,992.00) |
| දේපල පිරියත් හා උපකරණ ඉවත් කිරීමෙන් වූ පාඩුව | (24,822) | 2,800.00 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ලාභය** | **8,518,615** | **22,341,776.00** |
| වෙළෙඳ සහ අනෙකුත් ලැබීම් (වැඩිවීම/අඩුවීම) | (180,335,889) | 2,422,772.00 |
| තැන්පත් හා කලින් ගෙවීම් වල (වැඩිවීම/අඩුවීම) | 35,000 | 3,021,440.00 |
| රාජ්‍ය ආයතනවල ගෙවීම් (වැඩිවීම/අඩුවීම) | - | (1,344,176.00) |
| ණය ලබා ගැනීම් වල පොලිය (වැඩිවීම්/අඩුවීම) | - | (600,456) |
| වෙළෙඳ හා අනිකුත් ගෙවීම් වල (වැඩිවීම්/අඩුවීම්) | 195,478,334 | 12,745,366.00 |
| ලබන ලද අත්තිකාරම් වල (වැඩිවීම්/අඩුවීම්) | 3,300 | (1,630,177.00) |
| **මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල්** | **23,699,359** | **36,956,545.00** |
| පොළී ගෙවීම් | (175,005) | (343,497.00) |
| පාරිතෝශික ගෙවීම් | (221,742) | (209,268.00) |
| | 23,302,612 | 36,403,780 |

| දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2013 | 2012 |
|---|---|---|
| **ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී** | **රු.** | **රු.** |
| **මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල්** | | |
| දේපල පිරියත හා උපකරණ මිලට ගැනීම් | (3,998,559) | (14,990,341.00) |
| දේපල පිරියත හා උපකරණ ඉවත් කිරීමෙන් ලද මුදල් | 526,195 | 2,000.00 |
| ස්ථාවර තැන්පතුවල ආයෝජනය | (41,913,488) | (20,000,000.00) |
| පොලී ආදායම් | 4,757,611 | 717,885.00 |
| **මෙහෙයුම් ක්‍රියාවලියේ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(40,628,241)** | **(34,270,456.00)** |
| **මූල්‍ය ක්‍රියාවලියේ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | |
| භාණ්ඩාගාර ණය ලැබීම් | (1,860,000) | 9,300,000.00 |
| ණය නැවත ගෙවීම් | (762,314) | |
| **මූල්‍ය ක්‍රියාවලියේ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(2,622,314)** | **9,300,000.00** |
| **මුදල් හා ද්‍රවශීලතාවයේ ශුද්ධ වැඩිවීම** | **(19,947,944)** | **11,433,324.00** |
| **වසර මුල මුදල් හා ද්‍රවශීලතාවය** | **45,554,440** | **34,121,116.00** |
| **වසර අවසානයේ මුදල් හා ද්‍රවශීලතාවය** | **25,606,496** | **45,554,440.00** |

සැලසිනෙ
රූපවාහිනී
SELACINE
TELEVISION INSTITUTE

# මූල්‍ය වාර්තා සඳහා සටහන්

| 2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2013 | 2012 | 2011 |
|---|---|---|---|
| (ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී) | රු. | රු. | රු. |
| **11. සේවා සැපයීමෙන් ලබන ආදායම** | | | |
| නිෂ්පාදන | 40,541,319 | 27,611,388 | 24,403,033 |
| ග්‍රැෆික් | 27,525,225 | 38,617,520 | 11,464,431 |
| උපලේඛනගත කිරීම | 307,668,222 | 328,408,933 | 242,425,047 |
| වෙනත් | 277,409,997 | 43,301,580 | 102,025,127 |
| | 653,114,762 | 437,939,421 | 380,317,637 |
| **12. සෘජු පිරිවැය** | | | |
| නිෂ්පාදන වියදම් | 35,610,274 | 14,015,088 | 16,979,018 |
| ග්‍රැෆික් වියදම් | 23,771,275 | 31,884,512 | 9,870,442 |
| උපලේඛනගත වියදම් | 277,726,680 | 286,912,288 | 230,949,632 |
| වෙනත් වියදම් | 263,586,163 | 40,126,999 | 84,055,091 |
| | 114,910 | | |
| | 600,839,303 | 372,938,887 | 341,854,183 |
| **13. වෙනත් මෙහෙයුම් ආදායම්** | | | |
| සේවක ණය පොලී | 65,835 | 34,612 | 9,495 |
| බැංකු පොලී | 4,757,611 | 683,273 | 79,680 |
| වෙනත් පොලී | 42,542 | 24,988 | 126,405 |
| සැපයුම්කරුවන් ලියාපදිංචිය | 42,000 | 28,000 | 98,350 |
| Call Center ව්‍යාපෘතිය | | 40,000 | - |
| | 24,822 | | |
| | 4,932,80 | 810,873 | 313,350 |
| **14. බෙදාහැරීමේ වියදම්** | | | |
| ඉන්ධන | 1,464,716 | 1,229,499 | 1,018,188 |
| මෝටර් රථ අළුත්වැඩියාව සහ නඩත්තුව | 855,201 | 560,742 | 949,890 |
| ප්‍රවාහන, ගමන් ගාස්තු හා නවතා තැබීමේ ගාස්තු | 193,536 | 82,184 | 44,118 |
| අලෙවි ප්‍රවර්ධන වියදම් | 919,978 | 4,610,740 | 740,604 |
| අලෙවි දිරි දීමනා | 645,377 | 894,170 | 688,164 |
| රක්ෂණ අලාභය | - | 14,938 | |
| | 4,078,809 | 7,392,272 | 3,440,965 |

| 2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2013 | 2012 | 2011 |
|---|---|---|---|
| **(ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී)** | **රු.** | **රු.** | **රු.** |
| **15. පරිපාලන වියදම්** | | | |
| වැටුප් හා වේතන | 16,619,293.80 | 14,499,759 | 13,485,650 |
| සේවක අර්ථසාධක අරමුදල | 1,562,712.80 | 1,422,470 | 1,337,512 |
| සේවක භාරකාර අරමුදල | 310,347.54 | 284,264 | 267,503 |
| සේවක අතිකාල හා යැපීම් දීමනා | 1,596,083.63 | 835,764 | 669,467 |
| දුරකථන | 541,853.97 | 432,285 | 406,394 |
| සේවක සුභ සාධනය | 2,222,640.00 | 1,369,735 | 1,091,662 |
| තැපැල් | 23,271.00 | 34,101 | 27,956 |
| මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය | 1,120,647.00 | 1,413,498 | 1,022,951 |
| විගණන ගාස්තු | 30,000.00 | - | 30,000 |
| පුහුණු කිරීමේ වැඩසටහන් | 770,710.00 | 657,078 | 24,438 |
| වාහන කුලී | 780,000.00 | 1,185,000 | 1,155,833 |
| විදුලිය | 108,528.24 | 418,502 | 647,716 |
| ප්‍රසාද දීමනා | 542,500.00 | 669,249 | 695,750 |
| පාරිතෝෂික දීමනා | 599,327.67 | 745,953 | 420,047 |
| අධ්‍යක්ෂක වේතන | 650,000.00 | 600,000 | 520,000 |
| ජලය | 61,435.20 | 119,926 | 79,788 |
| ලියාපදිංචි ගාස්තු | 43,570.00 | 73,589 | 21,400 |
| අළුත්වැඩියා හා නඩත්තු - කාර්යාලීය උපකරණ | 1,210,447.97 | 481,565 | 259,759 |
| අළුත්වැඩියා හා නඩත්තු - නිෂ්පාදන උපකරණ | 495,543.00 | 226,229 | 367,262 |
| පුවත්පත් වියදම් | 128,705.00 | 40,965 | 61,795 |
| ආගමික හා සංස්කෘතික වියදම් | 29,757.75 | 115,780 | 51,515 |
| සමාජීය සුභ සාධන | 283,000.00 | 212,853 | 74,050 |
| ගොඩනැගිලි වියදම් | 67,500.00 | 17,562 | - |
| වෘත්තිය ගාස්තු | 682,500.00 | 195,000 | - |
| ටෙන්ඩර් ගාස්තු | 20,500.00 | 17,500 | - |
| පරිවර්තන ගාස්තු | 253,300.00 | 98,070 | - |
| කාර්යාලීය උපකරණ - අලාභය | - | 2,800 | - |
| සේවක රක්ෂණ | 1,024,447.10 | | |
| වෙබ් අඩවි යාවත්කාලීන වියදම් | 74,500.00 | | |
| විදේශ ගමන් වියදම් | 300,848.50 | | |
| අධ්‍යක්ෂක මණ්ඩල දීමනා | 110,000.00 | | |
| | 32,263,970.37 | 26,169,495 | 22,718,447 |

| 2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2013 | 2012 | 2011 |
|---|---|---|---|
| **(ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී)** | රු. | රු. | රු. |
| **16. වෙනත් වියදම්** | | | |
| විවිධ වියදම් | - | 515,278 | 12,373 |
| නෛතික වියදම් | 198,000.00 | 429,475 | 77,000 |
| Call Center ව්‍යාපෘතිය | - | 504,657 | - |
| වෙනත් වියදම් | 1,806,789.65 | | - |
| Surcharge | 18,925.00 | | - |
| | 2,023,714.65 | 1,449,410 | 89,373 |
| **17. මූල්‍ය පිරිවැය** | | | |
| බැංකු ගාස්තු | 224,561.73 | 37,955 | 44,473 |
| බලපත්‍ර හා රක්ෂණ ගාස්තු | 243,050.38 | 826,976 | 209,316 |
| කල් බදු පොලී | 175,005.24 | 343,497 | 208,324 |
| | 642,617.35 | 1,208,428 | 462,113 |

**2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා**

**18. දේපළ, පිරියත හා උපකරණ**

| විස්තර | ලී බඩු සහ සවිකිරීම් | පරිගණක උපාංග | කාර්යාල උපකරණ | මෝටර් රථ | කැමරා සහ උපකරණ | ගිණුම්කරණ මෘදුකාංග | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 01.01.2013 දිනට පිරිවැය | 1,548,571 | 3,921,590 | 2,464,272 | 8,720,507 | 14,309,475 | 1,360,000 | 32,324,416 |
| එකතු කිරීම් | 128,308 | 1,045,362 | 307,715 | 1,613,750 | 203,425 | 700,000 | 3,998,559 |
| ඉවත් කිරීම් | - | - | - | (1,253,433.00) | - | - | (1,253,433) |
| 31.12.2013 දින තෙක් | 1,676,879 | 4,966,952 | 2,771,987 | 9,080,824 | 14,512,900 | 2,060,000 | 35,069,543 |
| ක්ෂය වීම් 01.01.2013 දිනට | 917,807 | 2,554,665 | 1,585,168 | 3,701,290 | 3,121,288 | 300,000 | 12,180,128 |
| වර්ෂය සඳහා වියදම | 100,235 | 465,483 | 113,900 | 1,098,698 | 1,684,734 | 192,459 | 3,655,509 |
| ඉවත් කිරීම් | - | - | - | (752,060) | - | - | (752,060) |
| 31.12.2013 දින තෙක් | 1,018,042 | 3,020,148 | 1,699,068 | 4,047,928 | 4,806,022 | 492,459 | 15,083,667 |
| ශුද්ධ පොත් අගය 31.12.2013 දින තෙක් | 658,837 | 1,946,804 | 1,072,919 | 5,032,896 | 9,706,878 | 1,567,541 | 19,985,876 |

| 2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2013 | 2012 | 2011 |
|---|---|---|---|
| (ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී) | රු | රු. | රු. |
| **19. ස්ථාවර තැන්පතු** | | | |
| ලංකා බැංකුව - ගිණුම් අංක 742656 | 500,000 | 500,000 | 500,000 |
| ලංකා බැංකුව - ගිණුම් අංක 73404 | 10,000,000 | 10,000,000 | - |
| ලංකා බැංකුව - ගිණුම් අංක 73405 | 11,706,959 | 10,000,000 | - |
| ප්‍රමුඛ බැංකුව - 103009002920 (ශ්‍රී ලංකා ඉතිරි කිරීම) | 300,000 | 300,000 | 300,000 |
| ලංකා බැංකුව - ගිණුම් අංක 74798 | 12,135,172 | | |
| ලංකා බැංකුව - ගිණුම් අංක 74401 | 26,000,000 | | |
| ලංකා බැංකුව - ගිණුම් අංක 75021610 | 2,071,357 | | |
| | 62,713,488 | 20,800,000 | 300,000 |
| **20. වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ** | | | |
| වෙළඳ ණය ගැතියෝ | 295,705,548 | 118,166,373 | 124,962,586 |
| උත්සව අත්තිකාරම් | 144,000 | 75,000 | 78,500 |
| සේවක ණය | 1,947,144 | 945,130 | 657,160 |
| වැටුප් අත්තික්කාරම් | 5,000 | - | 14,500 |
| රඳවා ගැනීමේ බදු | 4,556,283 | 4,556,283 | 4,556,283 |
| ආර්ථික සේවා ගාස්තු | 3,913,602 | 3,913,602 | 2,806,023 |
| උපාලි පුවත්පත් | 10,695 | 10,695 | 10,695 |
| සීමාසහිත එක්සත් පුවත්පත් සමාගම | 2,500,181 | 3,528,092 | 3,036,081 |
| විජය පුවත්පත් | 172,245 | 172,245 | 172,245 |
| ඊ.ඒ.පී. ආයතනය | 3,004 | 3,004 | 3,004 |
| | 63,558 | | |
| ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව | - | - | 207,835 |
| ස්වාධීන රූපවාහිනිය | - | - | 138,557 |
| ලක් හඬ ගුවන්විදුලිය | - | - | 77,938 |
| ආපසු ලැබිය යුතු තැන්පතු | 100,000 | 100,000 | 102,550 |
| සේවක සුභසාධක සංගමය | - | - | 5,650 |
| සෙලින්කෝ ඉන්ෂුවරන්ස් | 62,050 | 33,458 | 45,931 |
| | 2,656,462 | - | - |
| | 311,839,772 | 131,503,883 | 136,875,538 |
| **20. (a) වෙළඳ ණයගැතියෝ** | | | |
| වෙළඳ ණයගැතියෝ 2013 වසර තෙක් | 303,287,741 | 124,385,656 | 128,243,987 |
| අඩුකළා : | | | |
| බොල් ණය සඳහා වෙන් කිරීම් 2012 | 7,582,193 | 6,219,283 | 3,281,400 |
| | 295,705,548 | 118,166,373 | 124,962,586 |

| 2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2013 | 2012 | 2011 |
|---|---|---|---|
| (ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී) | රු. | රු. | රු. |
| **21. තැන්පතු හා පෙර ගෙවුම්** | | | |
| බැංකු ඇපකර | - | 100,000 | 2,621,440 |
| පෙර ගෙවුම් | - | - | 500,000 |
| | 65,000 | - | - |
| | 65,000 | 100,000 | 3,121,440 |
| **22. මුදල් හා මුදල් සමාන දෑ** | | | |
| ලංකා බැංකු ගිණුම - 2323299 | 18,599,600 | 18,892,885 | 26,413,618 |
| ලංකා බැංකු ඉතිරි ගිණුම - 2329765 | 6,736,471 | 26,661,555 | 7,410,266 |
| මර්චන්ට් බැංකුව | - | - | 5,000 |
| මහජන බැංකුව | - | - | 1,500 |
| අතේ ඇති මුදල් | | - | 15,007 |
| නිෂ්පාදන අත්තිකාරම් | 135,425 | - | 222,425 |
| අනෙකුත් අත්තිකාරම් | 135,000 | - | 53,300 |
| | 25,606,496 | 45,554,440 | 34,121,116 |
| **23. සමුච්චිත ලාභ / (අලාභ)** | | | |
| ඉදිරියට ගෙනා ශේෂය | 26,194,953 | 9,100,002 | 12,540,425 |
| එකතු කළා : කපා හරින ලද ආරම්භක ශේෂ (උපලේඛනය අ) | 1,823,129 | 1,433,174 | 340,012 |
| | 28,018,082 | 10,533,176 | 12,880,437 |
| අඩු කළා : පෙර වසරේ ගැළපීම් (උපලේඛනය ආ) | 6,162,663 | 5,776,166 | (11,319,669) |
| | 21,855,419 | 4,757,010 | 1,560,767 |
| වසර සඳහා ලාභය / (අලාභය) | 13,210,740 | 21,437,942 | 7,539,235 |
| | 35,066,158 | 26,194,953 | 9,100,002 |

| 2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2013 | 2012 | 2011 |
|---|---|---|---|
| (ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී) | රු. | රු. | රු. |
| **23. (අ) කපා හරින ලද ආරම්භක ශේෂයන්** | | - | - |
| අධ්‍යක්ෂක වේතන | | - | - |
| ප්‍රසාද දීමනා | | - | - |
| බැංකු ණය | | - | - |
| මෙහෙයුම් සඳහා ණය | | - | - |
| පන්හිඳ රක්ෂණය | | - | - |
| ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය | | - | - |
| දිරි දීමනා | | - | - |
| රඳවා ගැනීමේ බද්ද | | - | - |
| වෙළඳ සහ වෙනත් ගෙවීම් | 1,550,000 | | |
| ජංගම දුරකථන ගාස්තු | | - | - |
| සේව අර්ථසාධක අරමුදල | | - | 173,895 |
| සේවා භාරකාර අරමුදල | | - | 141,117 |
| ආයතන ව්‍යුහය | | - | 25,000 |
| අවලංගු කරන ලද චෙක්පත් | 245,500 | 80,000 | - |
| පාරිතෝෂික ගැලපීම් | 27,629 | 8,998 | - |
| රාජ්‍ය ආයතනය සැපයු අරමුදල් | | 1,344,176 | - |
| | 1,823,129 | 1,433,174 | 340,012 |
| **23. (ආ) පසුගිය වසරේ ගැළපීම්** | | | |
| විගණන ගාස්තු | 30,000 | - | 132,451 |
| ආර්ථික සේවා ගාස්තු | | - | 187,237 |
| විදුලිය | | - | 141,922 |
| පාරිතෝෂික දීමනා | | - | 1,265,127 |
| ආපදා ණය | | 6,000 | 202,408 |
| උත්සව අත්තිකාරම් | | 3,500 | 42,099 |
| ණය ගැතියෝ | 5,376,506 | 5,742,616 | 178,606 |
| මහනුවර ෆිනෑන්ස් | | - | 992 |
| ගණකාධිකරන ගාස්තු | | - | - |
| ක්ෂය වීම පෙර වර්ෂ සඳහා | 691,157 | - | 8,014,565 |
| ණය ගැතියෝ | | - | 654,261 |
| බැංකු ඇපකර | | - | 500,000 |
| වැටුප් අත්තිකාරම් | | 14,500 | - |
| ලැබිය යුතු තැන්පතු | | 2,550 | - |
| මර්චන්ට් බැංකුව | | 5,000 | - |
| පීපල්ස් බැංකු | | 1,500 | - |
| අතඉතිරි මුදල් | | 500 | - |
| වාහන කුලිය | 65,000 | | |
| | 6,162,663 | 5,776,166 | 11,319,669 |

සැලසිනෙ රූපවාහිනී SELACINE TELEVISION INSTITUTE

| 2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2013 | 2012 | 2011 |
|---|---|---|---|
| (ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී) | රු. | රු. | රු. |
| **24. රාජ්‍ය ආයතන මඟින් සැපයූ අරමුදල්** | | | |
| රාජ්‍ය ආයතන මඟින් සැපයූ අරමුදල් | - | - | 1,344,176 |
| | - | - | 1,344,176 |
| **25. ගෙවිය යුතු පාරිතෝෂික දීමනා** | | | |
| ඉ/ගෙ ශේෂය | 4,053,061 | 3,516,376 | |
| එකතු කළා: වර්ෂය සඳහා පාරිතෝෂික වියදම් | 599,328 | 745,953 | |
| | 4,652,389 | 4,262,329 | |
| අඩු කිරීම් : පාරිතෝෂික ගෙවීම් | 221,742 | (209,268) | |
| ගෙවිය යුතු පාරිතෝෂික දීමනා | 4,430,648 | 4,053,061 | 3,516,376 |
| **26. පොලී ගෙවිය යුතු ණය** | | | |
| ලංකා බැංකු කල් බදු ණය හිමියෝ | | | |
| 1. මයික්‍රෝ වෑන් පීඩී 9583 | | 959,541 | 1,308,465 |
| අඩු කළා : වසර තුළ කළ ගෙවීම් | | (348,924) | (348,924) |
| | | 610,617 | 959,541 |
| අඩු කළා : ජංගම වගකීම් වලට මාරු කිරීම් | | | |
| ලංකා බැංකු බදු වාරික | 256,412 | | |
| ලංකා බැංකු බදු පොලී | 92,512 | (348,924) | (348,924) |
| | | 261,693 | 610,617 |
| විලම්බිත නොවන පොලී | 65,190 | | - |
| වසර තුළ කළ ගෙවීම් | (125,831) | (60,641) | 65,104 |
| | | 322,334 | 545,513 |

| 2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | | | 2013 | 2012 | 2011 |
|---|---|---|---|---|---|
| **(ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී)** | | | රු. | රු. | රු. |
| 2. බජාජ් ත්‍රීවීලර් වයි.කේ 3144 | | 145,158 | | 279,150 | 401,976 |
| අඩු කළා : වසර තුළ කළ ගෙවීම් | | (133,992) | | (133,992) | (122,826) |
| | | 11,166 | | 145,158 | 279,150 |
| අඩු කළා : ජංගම වගකීම් වලට මාරු කිරීම් | | | | | |
| ලංකා බැංකු බදු වාරික | | | 124,381 | | |
| ලංකා බැංකු බදු පොලී | | | 9,611 | (133,992) | (133,992) |
| | | | | 11,166 | 145,158 |
| විලම්බිත නොවන පොලී | | 11,166 | 35,405 | | |
| වසර තුළ කළ ගෙවීම් | | - | (25,793) | 9,612 | 35,405 |
| | | - | | 1,554 | 109,753 |
| 3. මිට්සුබිෂි එල්.300 - වෑන් පි. ඞී. - 0578 | | 1,848,463 | | 2,320,411 | 2,359,740 |
| අඩු කළා : වසර තුළ කළ ගෙවීම් | | (471,948) | | (471,948) | (39,329) |
| | | 1,376,515 | | 1,848,463 | 2,320,411 |
| අඩු කළා : ජංගම වගකීම් වලට මාරු කිරීම් | | | | | |
| ලංකා බැංකු බදු වාරික | 355,624 | | 315,599 | | |
| ලංකා බැංකු බදු පොලී | 116,324 | (471,948) | 156,349 | (471,948) | (471,948) |
| | | 904,567 | | 1,376,515 | 1,848,463 |
| විලම්බිත නොවන පොලී | 448,190 | | 517,232 | | |
| වසර තුළ කළ ගෙවීම් | (156,349) | 291,841 | (191,870) | 325,362 | 517,232 |
| | | 612,726 | | 1,051,153 | 1,331,231 |
| මුළු එකතුව | | 612,726 | | 1,375,041 | 1,986,497 |
| **27. වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ** | | | | | |
| වෙළඳාම් සඳහා කලයුතු ගෙවීම් (අ) | | | 371,925,607 | 176,098,350 | 163,352,984 |
| බදු ණය හිමියන් (ආ) | | | 605,940 | 954,864 | 954,864 |
| | | | 372,531,547 | 177,053,214 | 164,307,848 |

සැලසිනෙ රූපවාහිනී SELACINE TELEVISION INSTITUTE

| 2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2013 | 2012 | 2011 |
|---|---|---|---|
| (ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී) | රු. | රු. | රු. |
| **27. (අ) වෙළඳාම් සඳහා කලයුතු ගෙවීම්** | | | |
| වෙළඳ ණය හිමියෝ | 258,071,321 | 106,431,355 | 116,665,200 |
| සේවක අර්ථසාධක අරමුදල | 15,439 | 6,559 | 202,455 |
| සේවක භාරකාර අරමුදල | - | - | 24,295 |
| අතිකාල හා යැපීම් දීමනා | 145,275 | 41,396 | 49,322 |
| මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය | - | - | 65,350 |
| සණස සමිතිය | 43,120 | 43,120 | 43,120 |
| දුරකථන වියදම් | 17,612 | 33,369 | 40,837 |
| ජලය | - | - | 6,800 |
| විදුලිය | 125,423 | 637,365 | 347,365 |
| ගෙවිය යුතු කාර්යාල ආකෘති වියදම් | - | - | - |
| අලෙවි දිරි දීමනා | 18,826 | 386,808 | 457,767 |
| එකතු කළ අගය මත බද්ද | 94,972,378 | 54,974,145 | 35,917,495 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 16,905,054 | 10,730,024 | 7,945,568 |
| රඳවා ගැනීමේ බද්ද | - | - | - |
| ගෙවිය යුතු ගොඩනැගිලි කුලී | 900,000 | 900,000 | 900,000 |
| ආර්ථික සේවා ගාස්තුව | 313,858 | 313,858 | 635,592 |
| මෙට්‍රොපොලිටන් කාර්යාලය | 327,498 | - | - |
| විගණන ගාස්තුව | 60,000 | 30,000 | 30,000 |
| ඉන්ධන | 9,811 | 20,351 | 21,818 |
| Ministry of mass Media & Information (Vehicle) | - | 1,550,000 | |
| | 371,925,607 | 176,098,350 | 163,352,984 |
| **27. (ආ) බදු ණය හිමියන්** | | | |
| ලංකා බැංකු ණය හිමියන්ට කළ යුතු ගෙවීම් මයික්‍රෝ වෑන් පීබී 9583 | - | 959,541 | 1,308,465 |
| අඩු කළා : | | | |
| ගෙවිය යුතු ලංකා බැංකු බදු වාරික | - | (256,412) | (223,093) |
| ගෙවිය යුතු ලංකා බැංකු බදු පොලී | - | (92,512) | (125,831) |
| | - | 348,924 | 348,924 |

| 2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2013 | 2012 | 2011 |
|---|---|---|---|
| (ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී) | රු. | රු. | රු. |
| ලංකා බැංකු ණය හිමියන්ට කළ යුතු ගෙවීම් බජාජ් ත්‍රීවීලර් වයි.කේ 3144 | 133,992 | 145,158 | 279,150 |
| ගෙවිය යුතු ලංකා බැංකු බදු වාරික | (11,060) | (124,382) | (108,199) |
| ගෙවිය යුතු ලංකා බැංකු බදු පොලී | (106) | (9,610) | (25,793) |
| | 133,992 | (133,992) | 133,992 |
| ලංකා බැංකු ණය හිමියන්ට කළ යුතු ගෙවීම් මිට්සුබිෂි එල්.300 - වෑන් පී. ඩී. - 0578 | 1,376,515 | 1,848,463 | 2,320,411 |
| ගෙවිය යුතු ලංකා බැංකු බදු වාරික | 355,624 | 315,599 | (280,078) |
| ගෙවිය යුතු ලංකා බැංකු බදු පොලී | 116,324 | 156,349 | (191,870) |
| | 471,948 | 471,948 | 471,948 |
| මුළු එකතුව | 605,940 | 686,880 | 954,864 |

**28. සම්බන්ධිත පාර්ශවයන් හෙළිදරව් කිරීම (එස්.එල්.ඒ.එස්. 30)**

| නම | තනතුර | සම්බන්ධතා පාර්ශව ගනුදෙනු පිළිබඳ ස්වභාවය | ලිපිනය |
|---|---|---|---|
| 01. ප්‍රදීප් එදිරිසිංහ | සභාපති | නැත | නො. 283/7, ගාලුපාර, කොල්ලුපිටිය, කොළඹ 03. |
| 02. ඊ. එම්. ඒ. ආර්. ඒකනායක | සාමාන්‍යාධිකාරී | නැත | නො. 220, ගැමුණු මාවත, රාජගිරිය |

**2013 මුදල් වර්ෂය සඳහා සැලසිනෙ රූපවාහිනී ආයතනය සහ ඉහත දැක්වෙන එකිනෙක පුද්ගලයින් සහ ඔවුන්ගේ පවුලේ සමාජිකයින් සමඟ සම්බන්ධතා පාර්ශව ගනුදෙනු සිදුනොවිය.**

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } විඑම්1/ඊ/එස්සීටීඅයි/6/13/17
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2015 මැයි 22 දින.

සභාපති,

සැලසිනේ රූපවාහිනී ආයතනය.

**සැලසිනේ රූපවාහිනී ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව.**

---

මාගේ සමාංක හා 2015 පෙබරවාරි 10 දිනැති ලිපියට යොමුවේ

02. ඉහත සඳහන් ලිපිය සමහ එවන ලද මාගේ වාර්තාවේ දෙමළ අනුවාදය මේ සමහ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

පිටපත - 1. ලේකම් - ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය.

2. ලේකම් - මුදල් අමාත්‍යාංශය

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } ටීඑම්1/ඊ/එස්සීටීඅයි/6/13/17 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2015 පෙබරවාරි 10 දින.

සභාපති,
සැලසිනේ රූපවාහිනී ආයතනය.

**සැලසිනේ රූපවාහිනී ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව**

---

සැලසිනේ රූපවාහිනී ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. සැලසිනේ රූපවාහිනී ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට ( ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාචනය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය ව්‍යාචනය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ආයෝජන පොළී රු. 2,656,462 ක් ලැබුණු ආයෝජන පොළී ලෙස සලකා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුළත් කර තිබුණි.

(ආ) 2013 වර්ෂය සඳහා දේපල,පිරියත හා උපකරණ ක්ෂය රු. 117,117 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) 2006 වසරට පෙර සිට පැවති හඳුනා නොගත් ණය ශේෂය රු. 6,611,743 ක් වූ අතර ඒ සඳහා කරනලද වෙන්කිරීම රු.165,293 ක් විය. මෙම ණය අයකර ගැනීමේ හැකියාවක් නොමැති බව තහවුරු වී තිබූ අතර එවැනි තත්ත්වයකට අනුකූලව නොලැබෙන ණය වෙනුවෙන් ප්‍රමාණවත් වෙන්කිරීමක් සිදුකර නොතිබූ බව නිරීක්ෂණය විය.

#### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| | විෂයය | වටිනාකම<br>රු. | නොසැපයූ ලිඛිත සාක්ෂි |
|---|---|---|---|
| (අ) | ගෙවීම් | 13,891,056 | ගෙවීම් වවුචර 37ක් හා එයට අදාල විස්තර. |
| (ආ) | ස්ථාවර තැන්පත් | 300,000 | ශ්‍රී ලංකා ඉතිරිකිරීම් බැංකුවෙන් නිකුත් කළ තැන්පත් සහතිකය හෝ ශේෂ සනාථ කිරීමේ |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වෙළඳ ණයගැතියෝ | 258,071,312 | ණයහිමි පෝවල ලෙජර හා උපලේඛන . |
| (ඈ) | වාහන උපයෝජනය | - | එක් එක් වාහනය සම්බන්ධයෙන් (කුළී පදනම මත ලබාගත් වාහනද ඇතුළුව ) සමාලෝචිත වර්ෂය සඳහා සෑම මාසයක් සඳහාම භාවිතා කරන ලද ඉන්ධන ලීටර් ගණන, ඉන්ධන වටිනාකම, අළුත්වැඩියා හා නඩත්තු වියදම් විස්තර, ආයතනය භාරයේ ඇති වෙනත් රාජ්‍ය ආයතන සතු වාහන හා වෙනත් රාජ්‍ය ආයතන /අමාත්‍යාංශ වෙත ලබා දී ඇති ආයතනය සතු වාහන/කුළියට ගත් වාහන පිළිබඳ විස්තර. |

**2.3 නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම**

පහත දැක්වෙන අනුකූල නොවීම නිරීක්ෂණය විය.

| | නීති , රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2002 අංක 14 දරණ එකතු කළ අගය මත බදු පනතේ 21 වන වගන්තිය | 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.94,972,378 ක් එකතු කළ අගය මත බදු හා සමාලෝචිත වර්ෂයට අදාල බදු වාර්තා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත යවා නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය: | |
| | (i) මුදල් රෙගුලාසි 137 | සියලුම ගෙවීම් වවුචර අනුමතකල යුතු වුවද, මුළු වටිනාකම රු. 6,082,347 ක්වූ ගෙවීම් වවුචර 65 ක් අනුමත කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 156 (5) | ආයතනයේ මුදල් පොත නිරතුරුවම වෙනස්කර ඇති බව නිරීක්ෂණය වූ අතර එම වෙනස්කම් මුදල් රෙගුලාසි නියමයන් පරිදි සහතික කිරීම් කර නොතිබුණි. |
| | (iii) මුදල් රෙගුලාසි 381(3) | චෙක්පත් අත්සන් කිරීමට බලය ලබන නිළධාරීන් විසින් ඇපයක් තැබිය යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (iv) මුදල් රෙගුලාසි 386(5) | චෙක්පත් උපපත්‍රිකාවල කෙටි අත්සන් තැබීමට කටයුතු කර නොතිබුණි. |
| (v) මුදල් රෙගුලාසි 386 (7) | අවලංගු කරන ලද චෙක්පත උප පත්‍රිකාවට අමුණා චෙක්පොතෙහිම තබාගත යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (vi) මුදල් රෙගුලාසි 392 (ඇ ) (IV) | නිකුත් කරන ලද අලුත් චෙක්පත පිළිබඳ විස්තරද, මුල් චෙක්පතට හරස් යොමු සහිත අලුත් සටහනක්ද, අලුත් චෙක්පත නිකුත් කළ දිනය යටතේ ව්‍යවහාරයෙහි පවත්නා මුදල් පොතෙහි රතු තීන්තයෙන් සටහන් කළ යුතු, අතර මුදල් පිළිබඳ තීරු හිස්ව තැබිය යුතු වුවත් නිකුත් කරන ලද අලුත් චෙක්පත් සම්බන්ධව ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (vii) මුදල් රෙගුලාසි 395(ඌ) | මුදල් රෙගුලාසි නියමයන්ට පටහැනිව ආයතනයේ මුදල් පොත පවත්වාගෙන යන නිළධාරියා විසින්ම බැංකු සැසඳුම් සකස් කිරීමද කර තිබුණි. |
| (ඇ) 2000 ජුනි 27 දිනැති අංක පීඑෆ් / පීඊ / 09 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරන ලද රු.10,500,000 ක ආයෝජන සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ඈ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2 (ඇ) ඡේදය | ආයතනයේ සංවිධාන සැලැස්ම හා අනුමත කාර්ය මණ්ඩලය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලේඛනගත කර නොතිබුණි. |
| (ඉ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනය හා ස්ථාවර වත්කම් ලෙජරය යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි. |

### 2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

---

සමාලෝචිත වර්ෂයේදී ණයගැති ශේෂ 25 ක එකතුව වූ රු. 5,162,300 ක් විධිමත් අනුමැතියකින් තොරව රඳවාගත් ලාභයට ලියාහැර තිබුණි. තවද, සේවාදායකයාගේ අවශ්‍යතාවයට අනුව කාර්යය (Job) ඉටුනොකිරීම නිසා සේවාදායකයා විසින් ගෙවීම් ප්‍රතික්ෂේප කර තිබුණු රු. 1,888,852 ක්ද පොත් වලින් ලියාහැර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1. මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.13,210,740 ක ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වූ ශුද්ධ ලාභය රු.21,437,942 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,227,202 ක් හෙවත් සියයට 38 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ ආදායම පෙර වර්ෂයට වඩා සියයට 49 කින් ඉහල ගොස් තිබුණද සෘජු පිරිවැය සියයට 61 කින් හා පරිපාලන වියදම් සියයට 23 කින් ඉහලයාම මෙම පිරිහීමට හේතු වී තිබුණි.

3.2 ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික කටයුතු

බාහිර ආයතන දෙකක් විසින් නිර්මාණ කටයුතු වලට අදාළ මුදල් ලබාගැනීම සඳහා නඩු දෙකක් හා හිටපු සේවකයින් හතරදෙනෙකු වැඩතහනමට ලක්කිරීම හේතුවෙන් නඩු හතරක් පවරා තිබුණු අතර 2013 දෙසැම්බර් 31 දිනට නඩු කටයුතු වෙනුවෙන් දරන ලද වියදම රු. 140,000 ක් විය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

පෙර වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ නිර්මාණශීලී කටයුතු 20 ක් හා විශේෂ ව්‍යාපෘති 35 ක් අළුතින් ඉටුකර තිබුණු අතර එම කටයුතු වල වර්ධනය පිළිවෙලින් සියයට 17 ක් සහ සියයට 85 ක් විය. ආයතනයේ සමස්ත ආදායම සියයට 49 කින්ද වර්ධනය වී තිබුණි.

4.2 ආර්ථික නොවූ ගණුදෙනු

නියමිත කාලසීමාව තුල පාරිතෝෂික මුදල නොගෙවීම නිසා රු. 18,925 ක අධිභාරයක් ගෙවීමට සිදුව තිබුණි.

4.3 කාර්යමණ්ඩල පරිපාලනය

2013 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත ස්ථිර හා තාවකාලික කාර්ය මණ්ඩලය පිළිවෙලින් 31 ක් හා 21 ක් විය. තථ්‍ය කාර්ය මණ්ඩලය 55 ක් වූ අතර එය ස්ථිර සේවකයන් 14 කින් හා තාවකාලික සේවකයන් 41 කින් සමන්විත විය.

**4.4 වාහන උපයෝජනය**

2003 මාර්තු 28 දිනැති මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ එම්එෆ්/පීආර්/01/2003 ලිපිය ප්‍රකාරව වාහන කුළියට ලබාගත හැකි උපරිම මාසික කුළිය රු. 40,000 ක් වුවත්, ඊට පටහැනිව මාසික කුළිය රු. 65,000 ක් ගෙවීමේ පදනම මත වාහනයක් ලබා ගෙන තිබුණු අතර එම වාහනය වෙනුවෙන් 2013 වර්ෂයේදී වැඩිපුර ගෙවා තිබුණු මුදල රු. 300,000 ක් විය. තවද, මෙම වාහන කුළී පදනම මත ලබාගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 ආයතනය පිහිටුවීම**

මෙම ආයතනය 2001 දෙසැම්බර් 20 දින ජනසන්නිවේදන අමාත්‍යාංශය වෙත පවරා ගෙන තිබුණත්, එහි අරමුණු හා කාර්යයන් නිශ්චය කර බලතල ක්‍රියාත්මක කිරීමට පනතකින් හෝ වෙනයම් නීතියකින් විධිවිධාන සලසා නොතිබුණි. මෙම ආයතනය "සැලසිනේ ලිමිටඩ් "ලෙස සමාගම් පනත යටතේ පොදු සමාගමක් ලෙස ලියාපදිංචි කිරීමට 2009 සිට කටයුතු කරමින් තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම කටයුතු අවසන් කර නොතිබුණි.

**5.2 සංයුක්ත සැලැස්ම**

2011-2013 කාලපරිච්ඡේදය සඳහා ඉදිරිපත් කරන ලද සංයුක්ත සැලැස්මෙහි 2013 හි කළයුතු කාර්යයන් වශයෙන් ඕප්සෙට් මුද්‍රණ කටයුතු සිදුකිරීම සඳහා මුද්‍රණාලයක් ආරම්භ කිරීම හා රජයේ සංවර්ධන ක්‍රියාදාමයන් ඇතුළත් කරමින් අධ්‍යාපනික පුවත්පතක් ආරම්භ කිරීම හඳුනාගෙන තිබුණද එම කාර්යයන් ඉටුකර නොතිබුණි.

**5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 6.5.3 ඡේදය ප්‍රකාරව වාර්ෂික වාර්තා ගිණුම් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතු වුවද, 2003 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා වූ වාර්ෂික වාර්තා සකස් කර පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි.

6. පද්ධති හා පාලන

--------------------

විගණනයේදි නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා ආයතනයේ සභාපතිවරයා වෙත වරින්වර පෙන්වා දෙන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ස්ථාවර වත්කම් හා පරිගණක උපාංග පාලනය

(ආ) ගිණුම් තැබීම

(ඇ) ගෙවීම් වවුචර පිළියෙල කිරිම

(ඇ) බැංකු සැසඳුම්

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති ( වැඩබලන )

**සැලසිනෙ රූපවාහිනී ආයතනයේ**
**2013 දෙසැම්බර් 31 වෙනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ**
**මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව සඳහා පැහැදිලි කිරීම්**

**1.4 ආයතනයේ පිහිටුවීම**

මෙම ආයතනය 2001 දෙසැම්බර් 20 වෙනි දින ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත පවරාගෙන තිබුණ නමුත්, එහි අරමුණු හා කාර්යයන් නිශ්චයකර බලතල ක්‍රියාත්මක කිරීමට පනතකින් හෝ වෙනයම් නීතියකින් විධිවිධාන සලසා නොතිබුණි. මෙම ආයතනය සමාගම් පනත යටතේ සමාගමක් ලෙස ලියාපදිංචි කිරීමට කටයුතු කෙරෙමින් පවතී.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

(අ). ගිණුම් සටහන නිවැරදි කිරීමට කටයුතු කර ඇත. අවසන් ගිණුම් වාර්තාව සමග ඉදිරිපත් කරමි.

(ආ). සංශෝධිත ක්ෂය ප්‍රතිශතය පිළිබඳව ගිණුම් සටහනේ හෙළිදරව් කර ඇත. අවසන් වාර්තාව සමග ඉදිරිපත් කරමි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

(අ). 2012 වසරට අදාළව විගණන ගාස්තු වෙන් නොකිරීම හේතුවෙන් 2012 වර්ෂයේ ගෙවිය යුතු විගණන ගාස්තු ප්‍රමාණය අඩුවෙන් දක්වා ඇත. වරද නිවැරදි කර ඇත. අවසන් ගිණුම් වාර්තාව සමග ඉදිරිපත් කරමි.

(ආ). එය ප්‍රමාද දෝෂයකින් මඟහැරී ඇත. අවසන් ගිණුම් වාර්තාවට ඇතුළත් කර ඇත. එය සමග ඉදිරිපත් කරමි.

(ඇ). මුදල් ප්‍රවාහ ප්‍රකාශය අවසන් ගිණුම් වාර්තාව සමග ඔබ වෙත ඉදිරිපත් කරමි.

(ඈ). මෙය ගිණුම්කරණ පැකේජයට ඇතුළත් කිරීමේ දී ගිණුම් අංකයේ සුළු ප්‍රමාද දෝෂයක් මත සිදු වූවකි. අවසන් ගිණුම් වාර්තාව සමග නිවැරදි කර ඉදිරිපත් කරමි.

(ඉ). ගිණුම් සටහන් 4.1 අනුව ජංගම වගකීම් හා ජංගම නොවන වගකීම් ගිණුම් තබන පදනම මත මහා භාණ්ඩාගාර ණය ගිණුම නිවැරදි කර ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

(ඊ). 2013 වර්ෂයට අදාළව සත් දින ඇමතුම් තැම්පතුවල ආයෝජනය කරන ලද ලැබිය යුතු පොලී ආදායම සහ වෙනත් පොලී ආදායම් ගිණුම්වලට ඇතුළත්කොට සංශෝධිත අවසන් ගිණුම් වාර්තාව සමග ඔබ වෙත ඉදිරිපත් කරමි.

(උ). ප්‍රමිතයේ සඳහන් පරිදි පෙර වර්ෂයට අදාළව සිදුකරන ලද රු.691,157 ක් වූ ක්ෂය ගැලපීම සමාලෝචිත වර්ෂයේ ලාභයට ගලපා අවසන් වාර්තාව සමග නිවැරදිකොට ඉදිරිපත් කරමි.

(ඌ). මෙය නව කාර්යාල පරිශ්‍රය සඳහා දරන ලද වියදම් වන අතර, ආයතනය සතුව ගොඩනැගිල්ලක් නොමැති බැවින්, ප්‍රාග්ධනිත කර නොහැකිය යන කරුණු මත කාර්යාල නඩත්තු වියදම් හා ගොඩනැගිලි වියදම් ලෙස සමාලෝචිත වර්ෂයේ ලාභයට ගලපා ඇත.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

(අ).(අ). (i) නිෂ්පාදන අත්තිකාරම් ලෙජර් ගිණුම අනුව 2013 දෙසැම්බර් මස 31 වෙනි දිනට ශේෂය රු.135,425 ක අගය නිවැරදි ය.

| | |
|---|---|
| අයවීමට ඇති ශේෂය | - රු. 137,000.00 |
| ගෙවීමට ඇති ශේෂය | - රු. 1,975.00 - (ඇමුණුම 01) |
| 2013/12/31 වෙනි දිනට ශේෂය | - රු. 135,425.00 |

තවද රු.45,000 නිෂ්පාදන අත්තිකාරම් මුදල පියවා ඇති අතර එය සටහන් අංක 01 යොදා අත්තිකාරම් ලේඛනයේ පසු පිටට ගෙන රු.365,000 ට අදාළව පියවීම් කර ඇත.

(ii) අනෙකුත් අත්තිකාරම් ලෙජර් ගිණුම අනුව 2013 දෙසැම්බර් මස 31 වෙනි දිනට ශේෂය රු.135,000 ක අගය නිවැරදි ය. රු.5,000 ට අදාළව අත්තිකාරම් මුදල පියවා ඇති අතර, එය ප්‍රමාද දෝෂයකින් අත්තිකාරම් ලේඛනයේ ඇතුළත් කිරීමට නොහැකි වී ඇත. විගණනය වෙත ලබා දී ඇති අත්තිකාරම් ලේඛනය ලද පසු එම වරද නිවැරදි කිරීමට කටයුතු කරමි.

(ආ). මෙය නිවැරදිව ලෙජර් ගිණුම් ගතකර ඇති අතර ප්‍රමාද දෝෂයකින් සටහන් අංක 23 හි ගැලපීම් කරන ලද අගයන් හි අගය වැඩි වී ඇති අතර, එයින් අවසන් ප්‍රතිඵලයට බලපෑමක් සිදු වී නොමැත. කෙසේ වුවද එමගින් අංක 23 නිවැරදි කර අවසන් ගිණුම් වාර්තාව සමග ඔබ වෙත ඉදිරිපත් කරමි.

(ඇ). නඩු විභාග වෙනුවෙන් පෙනී සිටීම සඳහා ගෙවන ලද රු.140,000 ක් නීති වියදම් උපලේඛනය ප්‍රකාරව නිවැරදි වන අතර ඉතිරි රු.58,000 නීතිමය ලියවිලි සඳහා නීතිඥවරුන්ට ගෙවන ලද ගාස්තු වේ. එම නිසා ලෙජර් ගිණුම අනුව නීති වියදම් රු.198,000 ක අගය නිවැරදි ය.

### 2.2.4 ලැබිය යුතු ගිණුම්

(අ). මෙම ශේෂය ඉතා පැරණි වසරවල සිට ගිණුම්වල දැක්වෙන අතර, කිසිදු විස්තරයක් සොයා ගැනීමට නොහැකි බව 2012.10.05 රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේ දී පැහැදිලි කෙරිණි. ඒ අනුව මෙම ශේෂය ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කිරීම සඳහා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති අතර, අමාත්‍යාංශයේ නිර්දේශය සහිතව එය මහා භාණ්ඩාගාරය වෙත යවා ඇත.

(ආ). 2013.12.31 වෙනි දිනට ණයගැතියන්ගේ අවසන් ශේෂවල යම් යම් පැහැදිලි කරගැනීම් දක්නට ලැබුණි. නැවත පරීක්ෂා කළයුතු ශේෂ හැර ඉතිරි ණයගැතියන් සඳහා ද පසුව ශේෂ සනාථන ලිපි යැවීමට කටයුතු කර ඇත. එමගින් ඔවුන් විසින් එවන ලද ශේෂ සනාථන ලිපි 2014.06.13 වෙනි දින විගණනය වෙත ඉදිරිපත් කරන ලදී.

මෙහි සඳහන් රු.111,552 කට අදාළ (රු.5,712 හා රු.105,840) ණයගැති ශේෂයන් සඳහා මුදල් එම ආයතනවලින් 2013 දෙසැම්බර් මස ගෙවා තිබුණ ද අප වෙත ලැබී ඇත්තේ 2014 ජනවාරි මස දී එම වෙනස දැක්වෙන්නේ එබැවිනි. අදාළ රිසිට්පත් මේ සමග එවමි. - (ඇමුණුම 02, 03)

(ඇ). අධ්‍යාපන අමාත්‍යාංශයට අදාළ රු.91,615 ක් වූ ශේෂය 2011 වසරෙන් 2012.01.01 වෙනි දිනට ශේෂය ඉදිරියට ගෙන ඒමේදී කේවල ණයගැතියන්ගේ උපලේඛනයේ ආරම්භක ශේෂය ගිණුම්කරන පැකේජයට ඇතුළත් කිරීමේ දී සිදු වූ ප්‍රමාද දෝෂයකි. නමුත් එය 2012.12.31 වෙනි දිනට ණයගැති ලේඛනයේ දී හර ශේෂයක් ලෙස සටහන් කර ඇති බැවින් 2013.01.01 දිනට එම නිවැරදි හර ශේෂය රු.91,615 ක් ලෙස කේවල ණයගැතියන්ගේ උපලේඛනයේ ආරම්භක හර ශේෂය ලෙසට ගෙන නිවැරදි කර ඇත.

### 2.2.5 විගණන සඳහා සාක්ෂි නොවීම

(අ). ගෙවීම්

රු.13,891,056 ක අගයට අදාළ ගෙවීම් වවුචර් 37 ඔබ වෙත එවීමට කටයුතු කරමි.

(ආ). ස්ථාවර තැම්පතු

ප්‍රමුඛ බැංකුව සතුව පැවති රු.300,000 ක ස්ථාවර තැම්පතුව ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව වෙත පවරා ඇති අතර, ඊට අදාළ තැම්පතු සහතිකය මේ සමග ඉදිරිපත් කරන අතර, (ඇමුණුම 04) ශේෂ සනාථ කිරීමේ ලිපිය ලද විගස ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

(ඇ). ජ'නල් සටහන්

ජ'නල් සටහන් 43 කට අදාළ ගණනය කිරීම් විස්තරය හා උපයෝගී ලියවිලි ඔබ වෙත ඉදිරිපත්කොට ඇත.

(ඈ). ජ'නල් වවුචර්

අදාළ ජ'නල් වවුචර් 12 ද ඔබ වෙත ඉදිරිපත්කොට ඇත.

(ඉ). වෙළෙඳ ණයහිමි

ණයහිමි ලේඛනය හැකි ඉක්මනින් ඔබ වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

(ඊ). අඩමාණ ණය වෙන් කිරීම

අදාළ ගණනය කිරීම පිළිබඳ තොරතුරු මේ සමග ඉදිරිපත් කරමි. (ඇමුණුම 05)

(උ). වාහන උපයෝජනය

මේ සඳහා පිළිතුරු ලිපිය හැකි ඉක්මනින් විගණය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

(ඌ). සේවක පාරිශ්‍රමිකය

සේවක පාරිශ්‍රමිකය ඇතුළත් ටීඑම්/ඊ/එස්සීටිඅයි/2013/වී/තො/11 හා 2014.03.03 දිනැති ලිපියට පිළිතුරු විගණනයට ඉදිරිපත් කර ඇත.

### 2.2.6 ආර්ථික නොවූ ගනුදෙනු

මෙය අවසන් ගිණුම් වාර්තාව සමග නිවැරදි කිරීමට කටයුතු කරමි.

### 2.2.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම

(අ). මුදල් රෙගුලාසි 137

මින් ඉදිරියට මුදල් රෙගුලාසි 137 අනුගමනයකර විශේෂ අවධානයක් යොමු කරමින් ගෙවීම් කටයුතු කිරීමට අදාළ නිලධාරීන් දැනුවත් කරන ලදී.

(ආ). 2000 ජූනි මස 27 වෙනි දිනැති අංක පී/එෆ්/පීර්/09 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛනය

මේ සම්බන්ධව 2011 වසරේ දී අංක SE/ACC/03/DPST/1 දරන 2011.02.11 වෙනි දිනැති ලිපියේ දී ද 2013 දී SE/ACC/03/DPST/1 අංක දරන 2011.02.19 වෙනි දිනැති ලිපියේ දී ද ඒ බව දන්වා ඇත. එය අමාත්‍යාංශ ලේකම්තුමන් හරහා එවන ලෙස උපදෙස් ලැබී ඇත. වර්තමානයේ දී ඒ අනුව කටයුතු කර ඇත. (ඇමුණුම 06)

(ඇ). 2003 ජූනි මස 02 වෙනි දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛනයේ 9.2 (ඈ). ඡේදය

ආයතනයේ සංවිධාන සැලැස්ම හා අනුමත කාර්ය මණ්ඩලය සඳහා 2013 වසරේ දී රාජ්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇති අතර එය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කර ඇත.

(ඈ). 1978 දෙසැම්බර් මස 19 වෙනි දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛනය

වර්තමානයේ දී ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකොට ඉදිරිපත් කිරීමට අදාළ නිලධාරීන් දැනුවත්කොට ඇත.

(ඉ). 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 21 වෙනි වගන්තිය
සමාලෝචිත වර්ෂයට අදාළ බදු වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත යවා නොමැති අතර, ආයතනයේ නෛතිකභාවය තීරණය වූ වහාම නියමිත බදු ප්‍රමාණය අවශ්‍ය වූ අවස්ථාවක ක්ෂණිකව ගෙවීමට හැකි වන පරිදි ස්ථාවර තැම්පතු ගිණුමක තැම්පත් කරන ලදී.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

මෙම වර්ෂයේ දී රන්මිහි තැන්න චිත්‍රපටි ව්‍යාපෘතිය හා පොදු රාජ්‍ය මණ්ඩලීය නායකත්ව සමුළුව යන විශේෂ ව්‍යාපෘති ජාතික වැදගත්කම සලකා අවම ලාභ ප්‍රතිශතයක් මත සිදු කරන ලදී. එමගින් සමාලෝචිත වර්ෂයේ ආදායම පෙර වර්ෂයට වඩා 49% කින් ඉහළ ගොස් තිබුණි. එමෙන්ම අදාළ සෘජු පිරිවැය ද 61% කින් ඉහළ ගොස් ඇත. එය අවසන් මූල්‍ය ප්‍රතිඵලය අඩුවීමට හේතු වී ඇත.

### 3.2 ආයතනයට එරෙහිව ආරම්භකර ඇති නෛතික කටයුතු

බාහිර ආයතන දෙකක් විසින් නිර්මාණ කටයුතුවලට අදාළව මුදල් ලබාගැනීම සඳහා සහ හිටපු සේවකයින් හතරදෙනෙකු වැඩ තහනමට ලක් කිරීම හේතුවෙන් නඩු විභාග වෙනුවෙන් පෙනී සිටීම සඳහා රු.140,000 ක නීති වියදම් මෙම වර්ෂය තුළ දී දරන ලදී.

## 4 මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යය සාධනය

පෙර වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ නිර්මාණශීලි කටයුතු 17% කින් ද විශේෂ ව්‍යාපෘති 85% කින් ද සමස්ථ අදායම 49% කින් ද වර්ධනය වී ඇත.

### 4.2 කාර්ය මණ්ඩල පරිපාලනය

2013 දෙසැම්බර් 30 වෙනි දිනට අනුමත හා ස්ථිර කාර්ය මණ්ඩලය 31 සහ 21 වශයෙන් වී ඇත. සත්‍ය කාර්ය මණ්ඩලය 55 වුවත් එය ඉහත සඳහන් පරිදි ස්ථිර හා තාවකාලික වශයෙන් බෙදා වෙන් කිරීමට නියමිතය. ඒ සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය සකස්කර ඉතා ඉක්මනින් අනුමැතියට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. මෙයට අමතරව ආයතනයේ රාජකාරීමය අවශ්‍යතාව මත කොන්ත්‍රාත් පදනම මත සේවකයින් කිහිපදෙනෙකු බඳවා ගැනීම සඳහා 2014/07/16 වෙනි දින කළමනාකාර සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

### 4.3 වාහන උපයෝජනය

2013 දෙසැම්බර් මසට අදාළව වාහන කුලිය 2013 ජනවාරි මස ගෙවා තිබෙන අතර, 2014 ජනවාරි මසට අදාළ කුලිය 2013 දෙසැම්බර් මස ගෙවා ඇත. එය 2014 ගෙවිය යුතු මුදලින් ආවරණය කරනු ලැබේ. මෙය නිවැරදි කර අවසන් ගිණුම් වාර්තාව සමග ඉදිරිපත් කරමි.

මෙම ආයතනයේ සියලුම වියදම් දරනුයේ ලබාගන්නා ලද ආදායමෙන් වන අතර, කිසිදු ප්‍රතිපාදනයක් රජයෙන් නොලබයි. මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ MF/T/R/01/2013 දරන ලිපිය නිකුත්කර ඇත්තේ 2003.03.28 වෙනි දින වන අතර, වසර 10 ක් පැරණි මිල ගණන්වලට වර්තමානයේ දී සභාපති සඳහා සුදුසු වාහනයක් ලබාගැනීම අසීරු බැවින් සහ ආදායම් උපයන ආයතනයක් වශයෙන් ඉහළම තනතුර සඳහා උචිත වන ලෙස ප්‍රවාහන පහසුකම් පවත්වාගෙන යා යුතු බැවින් ද මෙම වාහන ලබාගෙන ඇත.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

අප ආයතනය මගින් ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍රයක් මිල දී ගෙන මුද්‍රණ ක්‍රියාවලියක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වුවද එහි ශක්‍යතා වාර්තාවක් ලබාගැනීමෙන් අනතුරුව එය ඉතා මිල අධික හා කාර්යබහුල ක්‍රියාවලියක් වූ හෙයින් ද ඒ සඳහා විශාල ආයෝජනයක් කිරීමට සිදුවන බව ද හඳුනා ගන්නා ලදි. විශේෂයෙන් ම මුද්‍රණ යන්ත්‍ර සවිකිරීම හා ඊට අවශ්‍ය ගොඩනැගිලි කුලියට ගැනීමත් ඒ සඳහා වෙනම පරිපාලන ඒකකයක් පිහිටුවීම වැනි කරුණු හේතුකොට ගෙන එම මුද්‍රණ යන්ත්‍රය පිළිබඳ අදහස් ඉවත් කරගැනීමට සිදුවිය.

මුද්‍රණ යන්ත්‍රයක් සහිත මුද්‍රණ ක්‍රියාවලිය ආරම්භ වූ පසු රජයේ සංවර්ධනයට අධ්‍යාපන පුවත්පතක් ආරම්භ කිරීමට තීරණය කර තිබුණි. ඉහත මුද්‍රණ ක්‍රියාවලිය හා බැඳුණු මෙම කාර්යය ද ඉහත කාර්යය ආරම්භ නොවූ නිසා ඉටුකර ගැනීමට නොහැකි විය.

### 5.2 අයවැය පාලනය

2014 වර්ෂයේ අයවැය ලේඛනය සකස් කිරීමේ දී අයවැය ගත ශේෂ පත්‍රය මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ අයවැය ගත ප්‍රාග්ධන වියදම් පිළිබඳ තොරතුරු ඇතුළත් කිරීමට උපදෙස් ලබාදෙන ලද අතර එය හැකි ඉක්මනින් ඔබ වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

### 5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 සිට 2008 වර්ෂය දක්වා වූ වාර්ෂික වාර්තා සකස්කර හැකි ඉක්මනින් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.

### 5.4 අධ්‍යක්ෂ මණ්ඩලය

2013 වර්ෂය සඳහා පත්කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලය රැස් වූ වාර ගණන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ සහභාගීත්වය හා ගනු ලැබූ තීරණ පිළිබඳ විස්තර විගණනය වෙත ඉදිරිපත් කර ඇත.

## 6. පද්ධති හා පාලන

විගණනයේ දී පෙන්වාදෙන ලද පද්ධති හා පරිපාලන දුර්වලතා කෙරෙහි විශේෂ අවධානය යොමුකර එම දුර්වලතා අවම කරගැනීමට අදාළ නිලධාරීන් දැනුවත් කරන ලදි.



**සභාපති**
**සැලසිනෙ රූපවාහිනී ආයතනය**



SELACINE
TELEVISION INSTITUTE


SELACINE TELEVISION INSTITUTE
No. 224, Bauddhaloka Mawatha, Colombo 7, Sri Lanka.
Tel.: +94 -11-2688744, +94 - 11-2058227, +94 - 4320777
Fax :- +94 -11-2058229
E-mail: selacine@gmail.com / infor@selacine.lk
www.selacine.lk